# මහ සභා රැස්වීම - 2025.10.09 දින
# අලව්ව ප්‍රාදේශීය සභාව

2025.10.09 දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ හයවන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා**

1. ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
13. ගරු ප්‍රාශීය සභා මන්ත්‍රිනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. චමින්ද මාල් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර පතිරණ මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
21. ගරු ප්‍රාශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ හය මහ සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමිය ප්‍රධාන සියලු ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා මා ඉතාමත් ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා. එමෙන්ම, අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය සහ එම නිළධාරීන් සියලු දෙනාත්, මේ අවස්ථාවට සම්බන්ධවන මාධ්‍යවේදීන් සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

## 01.2025.09.11 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම

**ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.09.11 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව සභා සම්මත කිරීමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.09.11 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ස්ථිර කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම සභා වාර්තාව සම්මත කිරීම මා ස්ථිර කරනවා.

ඒ අනුව 2025.09.11 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02.ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන - නැත

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම

### 3.1. නිවාඩු අනුමත කිරීම

**ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, පහත සඳහන් කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම සඳහා ඉදිරිපත් කරනවා.

**2025.10.06 දින මහ සභාව සඳහා නිවාඩු අනුමත කිරීම - නැත**

**2025.09.23 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද මාල් මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා

**2025.09.23 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද මාල් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා

**2025.09.24 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය

**2025.09.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවිර මැතිනිය
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඉහත සඳහන් කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, ඉහත සඳහන් කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

## 04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

## 05. යථා පරිදි කල්දී ඇති යෝජනා

**(05.1) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව - අංක 07/05/06/01 දරණ යෝජනාව**

අලව්ව ප්‍රාදේශිය සභාවේ සේවා ගිවිසුම් පදනම මත සේවය කරන පහත නම් සඳහන් සෞඛ්‍ය කම්කරු මහතුන්ගේ සේවා කාලය 2025.12.10 දින අවසන් වන බැවින්, ඔවුන්ගේ සේවා කාලය මාස 06 කින් දීර්ඝ කිරීමට මහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | නම | සේවා කාලය අවසන් වන දිනය | දීර්ඝ කිරීමට අවශ්‍ය කාලය |
|---|---|---|---|
| 1 | එච්.පී.ඩී. සුමිත් මංජුල ජයතිලක මයා | 2025.12.10 | 2025.12.11 සිට 2026.06.10 දක්වා |
| 2 | එම්.පී.උපුල්සමන්මුතුනායක මයා | 2025.12.10 | 2025.12.11 සිට 2026.06.10 දක්වා |
| 3 | ඊ.එච්.ඩී.සඳරුවන් ඒකනායක මයා | 2025.12.10 | 2025.12.11 සිට 2026.06.10 දක්වා |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව,අලව්ව ප්‍රාදේශිය සභාවේ සේවා ගිවිසුම් පදනම මත සේවය කරන ඉහත නම් සඳහන් සෞඛ්‍ය කම්කරු මහතුන්ගේ සේවා කාලය 2025.12.10 දින අවසන් වන බැවින්, ඔවුන්ගේ සේවා කාලය මාස 06 කින් දීර්ඝ කිරීම සුදුසු බවටඒකමතිකව සභා සම්මත විය.

**(05.2) ගරු ප්‍රාදේශීය මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව - අංක 07/05/06/02 දරණ යෝජනාව**

පසුගිය සංවර්ධන කමිටුවේදී අලව්ව ප්‍රදේශය භාර ජල සම්පත් මණ්ඩලයේ නිලධාරීතුමා විසින් සිදුකළ ඉල්ලීම පරිදි ජල සම්පත් මණ්ඩලය සඳහා හයිඩ්‍රන් ජලනල පද්ධතියක් ලබා දීම සුදුසු බවට මහසභාවේ අනුමැතිය දන්වා එම ආයතනයට ලිපියක් යොමු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ මහජන මන්ත්‍රීවරයා හැටියට නාරම්මල සභාවට යනකොට අද තමුන්නාන්සේලාගේ වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක ගුණසේන මැතිතුමා අපිත් සමඟ එකට කටයුතු කළා.ඊට පෙර වෙළඳ සංගමයේ සභාපතිවරයා ලෙස පුරා අවුරුදු 10ක් අලව්ව නගරයත් එක්ක ගණුදෙනු කරද්දී ගිනි ගැනීම්වලට ලක්වුණු අවස්ථා පහ හයක් තිබුණා. එවලෙහි ගිනි ගැනීම් නිවන්න නගරයේ ඉන්න පුද්ගලයෙක් විදිහට උදව් කරා.
වෙළඳ සංගමයේ සභාපතිවරයෙක් ලෙස කාර්යභාර්ය අවබෝධ කරගත් පසු, එවකට ජල සම්පත් මණ්ඩලයේ අලව්ව බල ප්‍රදේශයේ ඉංජිනේරු ලෙස කටයුතු කළ කිරිඇල්ල මහතාගෙන් විමසීම් කළ පසු, මේකට සවිකරන නල පද්ධතියක් අවශ්‍යයි මේක සෑම ප්‍රධාන නගරයකම තියනවා. මේ ඉල්ලීම සභාවට කළ යුතු බව එතුමා ප්‍රකාශ කළා. ඉන්පසු මහජන මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවක් ලෙස සභාවට යොමු කළ පසු ඒකච්ඡන්දයෙන් සම්මත වුණා.

එම තීරණය ජල සම්පත් මණ්ඩලයට යොමු කළ අතර, අලව්ව නගරයට අලුතින් ජලනල එලීම ක්‍රියාත්මක වෙන මොහොතේදී මෙම ඉල්ලීම ලබා දෙන බවට ඊට පිළිතුරු වශයෙන් අපට ලැබුණා. අලව්ව ප්‍රාදේශීය සභාව අලව්ව ලෙස වෙන් කළ මොහොතේදී, නැවත මෙම ඉල්ලීම කළා. එම මොහොතේදීත් පෙර පිළිතුරම ලබා දුන්නා. ඒනිසා අපි නගර සංවර්ධනයට අත දීලා, එම කටයුත්ත යන අතරේ ජලසම්පත් මණ්ඩලයෙන් ඇහුවා, ඔවුන් ඒක අනුමත වෙලා ඇවිත් තියෙන්නේ කීවා. අඟල් හතරක විශ්කම්භයකින් යුත් වතුර නලයක් යටින් යන එකේම අඟල් හතරකින් යුත් යකඩ නල කීපයක් තැන්තැන්වලින් ස්ථාපිත කරනවා. ඉස්සර ගිනි ගැනීමක් වුණාම මුලින්ම කාබුල් ලංකා එකට නැත්නම් කුරුණෑගලට කතා කරනවා. ඒ අවස්ථාවේදී ජලය ගන්න තැනක් නැහැ. මාකට් එකේ වහපු ළිඳෙන් එහෙම නැත්නම් නාටා ළිඳෙන් තමා වතුර ගන්නේ දෙපාරට ඒ ළිඳේ වතුර අවසන්. හැකියාවක් පවතී නම්, සාකච්ඡා කරලා නගරයට හෝ රාජ්‍ය ආයතන තියන තැන් අවට නල පද්ධති දෙකක්වත් ස්ථාපිත කරන්න කියලා ගිනි නිවීම් කටයුතු සඳහා පැමිණි පිරිස් ප්‍රකාශ කළා. එදා පැවති සම්බන්ධීකරණ කමිටුවේදී මේ පිළිබඳව යෝජනාවක් මහසභාවේ සම්මත කර එවන ලෙස ජල සම්පත් මණ්ඩලයේ නිලධාරී මහතා ඉල්ලීමක් කළා. ඒ නිසා තමා ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කළේ. රාජ්‍ය නිලධාරීන් අවුරුදු 55න් 60 න් රාජකාරිය අවසන් කර විශ්‍රාම ගියත් මහජන නියෝජිතයෝ හැටියට අප සියලුදෙනාම ගමේ ජනතාවට වගකියන්න ඕනි. අලව්ව නගරය තුළ ජනහිත ව්‍යාපාරය, නොතාරිස් කාර්යාලය අසල සිට කඩකාමර හතරක් ගිනි ගන්නකොට පහළ පියසුමන මුදලාලිලාගේ කඩකාමර ගිනි ගන්නකොට මේ සියල්ල අපි දැක්කා. මෙහි පැති දෙකක් තියනවා එකක් කඩ කාමර ගිනි ගන්නවා, පාරිභෝගිකයෝ හිටියොත් ඒ අයත් අළුවෙලා යනවා. ගන්න තීන්දුවේ වටිනාකම දෙපැත්තටම තියනවා. ප්‍රදේශයේ ජන ජීවිත සුරකීමක් තමා මේ තුළින් සිදුවෙන්නේ. ඒවගේම තමා අයිලන්ඩ් ප්‍රශ්නය. වෙළඳ සංගමයේ සභාපතිතුමාගේ කඩය ඉදිරිපිට කාන්තාවක් හැප්පිලා අත් දෙක කැඩුණා. මම මේ සභාවවල දැක්ක හොඳම දේ තමා, කවුරු හෝ මන්ත්‍රීවරයෙක් සභාවට යෝජනාවක් ඉදිරිපත් කළොත් ඒකත්ඡන්දයෙන් සම්මත වුණා විතරයි කවුරුත් ඒකේ කොනක හිටියේ නැහැ. මේ වන විට මේ කටයුත්ත ආරම්භ කරලා තියනවා නම්, ඒ සම්බන්ධව ඔබතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ස්තූතිවන්ත වෙනවා. රාජකාරීමය අවශ්‍යතාවය හේතුවෙන් ජල සම්පත් මණ්ඩලයේ නිලධාරී මහතා මෙම යෝජනාව සම්බන්ධයෙන් මහසභාවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමක් සිදුකළ නිසා මේ පිළිබඳව යෝජනාව ඉදිරිපත් කළේ. ඔබ සියලු දෙනා එකතු වෙලා ගන්න තීන්දුව සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරලා TC යනකොට නීත්‍යානුකූලව හා රාජ්‍ය නිලධාරීන් අපහසුතාවයකට පත් නොවන ලෙස සාර්ථකව කටයුත්ත සිදු වෙනවා. මහජන නියෝජිතයන් හැටියට ගරු සභාපතිතුමනි, අලව්ව නගරය සංවර්ධනය වෙමින් ඉදිරියට යන අවස්ථාවේ නගරයේ වෙළඳ ප්‍රජාව පමණක් නොව නගරයේ වෙළඳ ප්‍රජාව පෝෂණය කරන පාරිභෝගිකයා ඇතුළු දෙපාර්ශවයේම ආරක්ෂාව සඳහා මේ තීන්දුව ගන්නේ මේ සම්බන්ධයෙන් ඔබතුමා අවකාශය ලබා දීම සම්බන්ධව ගරු සභාවට මගේ ස්තූතිය ප්‍රකාශ කරනවා. මගේ වචන ප්‍රකාශ කිරීම මෙයින් අවසන් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මොහාන් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අදාලව න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේදී හයිඩ්‍රජන් ලෙස සඳහන් වී ඇති අතර, එය හයිඩ්‍රන් නල පද්ධතිය ලෙස නිවැරදි විය යුතුයි. මොහාන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කලා වගේ ප්‍රධාන නල පද්ධතියත් සමඟ පාරේ අවශ්‍ය ස්ථානවල රතු පාටින් කාණුවක් තමා ස්ථාපිත කරන්නේ. මේක තියෙන්නේ හදිසි අවස්ථාවයකදී ජලය ලබා ගන්න. එදා සම්බන්ධීකරණ කමිටුවේදී ගත්ත මෙම යෝජනාවට කුරුණෑගලින් අනුමැතිය ලැබිලා තියනවා. ඊට අමතරව ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ඇණවුම කොළඹට දීලා තියනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු වෙමින් තියනවා, මම සොයා බැලුවා . නමුත් කොළඹට ඇණවුම් කරන ලද බඩුවල අඩුපාඩු කිහිපයක් තියනවා කීවා. ඒවගේම මෙම නල පද්ධතිය ස්ථාන තුනක ස්ථාපිත කිරීම සඳහා සැලසුම් කරලා තියනවා. නාරම්මල හන්දියේ පළමු නල පද්ධතිය ළඟදීම ස්ථාපිත කරන බවත්, ඉතිරි දෙක අලව්ව ප්‍රදේශයේ ස්ථාන දෙකක ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති බවත් ජල සම්පත් මණ්ඩලය ප්‍රකාශ කළා. සම්බන්ධීකරණ කමිටුවෙන් යෝජනා වී, කුරුණෑගලින් අනුමැතිය ලැබී මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින නිසා සභාව හරහා යෝජනාවක් සම්මත වීම අවශ්‍යද කියන ගැටලුව මට තියනවා. මොහාන් මන්ත්‍රීතුමාගේ යෝජනාවට විරුද්ධතාවයක් නැහැ. ප්‍රාදේශීය සභාවේ යෝජනාවක් සම්බන්ධීකරණයට යා යුතු අතර, සම්බන්ධීකරණ කමිටුවේ සභාපති කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය ලේකම්තුමියගේ ඉදිරියේ,

සම්බන්ධීකරණ කමිටුවේ දී ගත් තීරණයක් නැවත මහජන මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවක් ලෙස මහසභාවේ සම්මත කර ජල සම්පත් මණ්ඩලයට ලබා දිය යුතු ද යන ප්‍රශ්නය මතුවෙනවා. කොහොම වුණත් මේ කටයුත්ත ආරම්භ වෙලා තියනවා. කෙටි කාලයකින් නාරම්මල හන්දියේදී පළමු තැන ස්ථාපිත කරනවා. ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ගරු මොහාන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව ඉතාම කාලෝචිතයි. ඒවාගේම නගරයට මේක අත්‍යාවශ්‍ය කාරණයක්. පසුගිය කාලයේ කුරුණෑගලත් ගින්නක් හට ගත්තා, නාරම්මලත් වෙළඳ සැල් ගිනි ගත්තා. ප්‍රියන්ත මන්ත්‍රීතුමා කීව පරිදි ඊට අදාල ක්‍රියාවලිය යනවා නම් වඩාත් හොඳයි. මෙම යෝජනාව සභාපතිතුමාගේත් මන්ත්‍රී මණ්ඩලයේත් ඒකමතික යෝජනාවක් ලෙස සම්මත කරලා ගරු සභාපතිතුමාගේ අනු දැනුම මත සම්බන්ධීකරණ කමිටුවට යවමු. අශෝක මන්ත්‍රීතුමා හරහා යන ඒ වැඩපිළිවෙල ඉතාම වටිනවා එතුමාගේ ශක්තියත් අවශ්‍යයි. සභාවක් හැටියට අපේ ශක්තිය ඔක්කොම එකතු කරලා අපිට පුළුවන් හොඳ නිර්මාණාත්මක නගර සංවර්ධනයක් කරගන්න. විශේෂයෙන්ම මැද අයිලන්ඩ් එක මාත් පිළිගත්තේ නැහැ. ඒත් මාත් ගිය සතියේ මොහාන් මන්ත්‍රීතුමාගේ ගෙදරට බයක් එක හරවද්දී ලොකු ඉඩක් තියෙන්නේ වාහන ඉබාගාතේ දානවා. අඩියක ප්‍රමාණයක හරි අයිලන්ඩ් එකක් දානවා නම් වටිනවා. පාර පළල වැඩි නිසා අනතුරු වෙන්න පුළුවන් ඉඩකඩ වැඩියි. අපි පටන් ගත්ත ආණ්ඩුවේ මේ සංවර්ධනය ඉතාම වටිනවා. අපි අගය කළ යුතුයි. මම නම් හදවතින්ම සුභ පතනවා පක්ෂ පාට බේද නැහැ. අපේ රට ජනතාවගේ රට අපිට ඕනි දියුණු කරගන්න. අපේ ගමේ අමුණක් හදන ව්‍යාපෘතියක් යනවා. මීගාර මන්ත්‍රීතුමා කරන්නේ. අමුණ හදන තැනට මම හැමදාම යනවා. ඒක අපිට වටින හොඳ වැඩක්. හොඳ වැඩට හොඳයි කියන්න ඕනි. ඒවගේම උද්ධාල මන්ත්‍රීතුමාගේ වැඩක් පටන් ගත්තා එතුමා මට එන්න කීවත් දයාසිරි මන්ත්‍රීතුමාගේ හෙට්ටිපොල වැඩක් තිබ්බා මට යන්න බැරි වුණා. ඉතින් අපි සුභ පතනවා අපේ කාලයේ යම්කිසි අඩුපාඩුවක් වුණානම් දැන් ඒවා කරනවා නම් අපි හදවතින්ම සතුටු වෙන්න ඕනි. හොඳ වැඩ කරනකොට පක්ෂ පාට බේදයකින් තොරව සහයෝගය දෙන්න ඕනි. ඒක තමා අපේ තියන මානව හිතවාදී ගති ගුණය. ගරු සභාපතිතුමා සිදු කරන හැම හොඳ වැඩකදීම උදව් කරනවා. ඒ අනුව හයිඩ්‍රන් නල පද්ධතිය සභාවේ ගරු සභාපතිතුමාගේ, ගරු මන්ත්‍රීවරුන්ගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ සහ රජයේ නිලධාරීන්ගේ සහයෝගය ඇතිව විධිමත් ලෙස නගරයේ ජනතාව වෙනුවෙන් අපේ සම්පත් වෙනුවෙන් මේක ඒකමතිකව සම්මත කරගමු. ඒවලේම අයිලන්ඩ් ප්‍රශ්නයත් ගරු සභාපතිතුමා, ලේකම්තුමිය මැදිහත් වෙමින් ආයතන සමඟ සාකච්ඡා කර ඊට අවශ්‍ය සහයෝගය ලබා ගනිමින් අඩියක ප්‍රමාණයක්වත් අයිලන්ඩ් එකක් දාන යෝජනාව මේක ඇතුළේම ඉදිරිපත් කරමින් රිය අනතුරු අවම කර ගැනීමට සහ මිනිස්සු වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිනවා. ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේක හොඳ වැඩක්. අපේ ප්‍රියන්ත ගරු මන්ත්‍රීතුමා කීවා මේ පිළිබඳව සම්බන්ධීකරණ කමිටුවේදී කතා කරලා තියනවා කියලා මෙතුමා මැදිහත් වෙලා ඒ සම්බන්ධව සොයා බලා තියනවා ඊට අවශ්‍ය වටපිටාව සලසා ගන්න තමා අවශ්‍ය වෙන්නේ. අද ගෙනාව යෝජනාවේදී මම පොඩි සංශෝධනයක් කරලා ඉදිරිපත් කරන්නම්. අලව්ව ටවුන් එකේ ඒ වැඩේ වෙනවානම්, ජල දිගුව මේ වන විට මහරච්චිමුල්ල සහ බෝයවලාන කියන ප්‍රදේශවලටත් ආවරණය වෙලා ඉවරයි. මේ නගර දෙක දියුණු වෙමින් පවතින නගර දෙකක් නිසා අපි මේ යෝජනාව සංශෝධනයන් සහිතව ගරු සභාපතිතුමාගේ අනුමැතියෙන් සම්බන්ධීකරණයට දාගමු. ඊළඟට ජල ව්‍යාපෘතිය ගැන කියන නිසා, ගරු මන්ත්‍රීතුමත් මතක් කරා ඊයේ ටැම්පිටිගොඩට ගියා ගල්ගමුව ප්‍රදේශයේ ගොඩාක් අය වතුර ඉල්ලනවා. වතුර ලයින් එක ජනතාවගේ ප්‍රයෝජනයට පන්ගොල්ල ඇතුළට, දුන්දෙනියට ඒවගේම ගරු අනිල් මන්ත්‍රීතුමාගේ ගෙවල් පාරේ අත්සන් ලේඛන සමඟ ගෙවල් තුන හතරකට ජල සම්පත් මණ්ඩලයෙන් දීලා තියනවා කීවා. ඉතින් අපි සමත් වුණා ඒ ප්‍රධාන පාරේ ලයින් එක ඇතුළට ගෙනියන්න.

ගල්ගමුව අවට ගිහින් බැලුවහම මීටර් 300ක් 400ක් ගන්න තිබ්බත් ගෙවල් 2, 3ක් තමා වතුර ගන්නේ. නමුත් ටැම්පිටිගොඩ සම්පූර්ණ ගලක් උඩට තියෙන්නේ අපි එතනට ගියා එතනදී ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන ඉංජිනේරු තුමායි, සාමාන්‍ය අධිකාරිතුමිය, පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක මැතිතුමත් සම්බන්ධ වුණා. ඒවෙලාවේ මාමා කෙනෙක් ඇවිත් මගේ ළිඳේ සති දෙකක් යනකොට වතුර නැහැ, ගලක තියෙන නිසා හිඳිලා යනවා කියලා කීවා. අපි මන්ත්‍රීවරු විදිහට මහජනතාවගේ ඡන්දයෙන් ප්‍රාදේශීය ආණ්ඩුකරණය කරද්දී මහජනතාවගේ අදහස්වලට ඇහුම්කම් දෙන්න ඕනි ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ මේක.

ප්‍රජාව සම්බන්ධ කරගෙන යන යාන්ත්‍රණවාදය කියන්නේ ඔවුන්ගේ මතවාද අදහස් එකට එකතු කරගෙන හොඳ යාන්ත්‍රණයකට යායුතුයි කියන එකයි. ඒ වෙනුවෙන් උපරිම කැපකිරීමක් කරනවා. ඒනිසා මගේ යෝජනාව සංශෝධන සහිතව මහරච්චිමුල්ලටත්, බෝයවලානටත් හයිඩ්‍රෝ පවර් එක ස්ථාපිත කරන්න කියලා යෝජනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මට එක ගැටලුවක් තියනවා මොහාන් මන්ත්‍රීතුමා ඒක මතක් කරා. නල පද්ධතිය කරලා කාපට් එලලා ඉවර වෙනකොට නැවත ආපහු ඒවා ඩැමේජ් කරන්න වෙනවා නල පද්ධතිය දානකොට ඒවා ඉතිරි කරලා තියනවා නම් හොඳයි. ඔබතුමා මුලින්ම කීවා මේක තීරණය කරලා තියෙන්නේ කියලා ඒකට බොහොම ස්තූතියි. නමුත් ප්‍රියන්ත මන්ත්‍රීතුමා මේ පිළිබඳව සොයා බලා මෙම නල පද්ධතිය නාරම්මල හන්දියේත් ඉතිරි දෙක ටවුන් එකේත් ස්ථාපිත කරනවා කියලා සඳහන් කරා. උද්ධාල මන්ත්‍රීතුමා කීවා වගේ එම හයිඩ්‍රන් නල පද්ධති මහරච්චිමුල්ලටත්, බෝයවලානටත් අවශ්‍යයි. ඊට අමතරව ගිරිඋල්ල පාරේ රාහුල ජාතික පාසල, ප්‍රාදේශීය සභාව, රෝහල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැනි රාජ්‍ය ආයතන කිහිපයක් තියනවා මේ අතර මැද්දටත් දෙකක්වත් ස්ථාපිත විය යුතුයි නේද? ඒ දේ දවසක කරගන්න පුළුවන් කියන එක නෙවේ මේ අවස්ථාවේම කරනවා නම් හොඳයි. ඒවගේම ප්‍රියන්ත මන්ත්‍රීතුමා කීවා මූලික අමද්‍රව්‍ය ටික සපයා ගන්න අපහසුයි කියලා. මන් හිතන්නේ, ශ්‍රී ලංකාවේ ෆයර් පිළිබඳව ඉංජිනියර්ස්ලා ඉන්නේ තුන් දෙනෙක් විතරයි. එතනින් එක් කෙනෙක් මගේ සහෝදරයා. අවශ්‍ය නම් එයා හරහා අවශ්‍ය අමුද්‍රව්‍ය ටික රටින් හරි ගෙනල්ලා දෙන්න පුළුවන් ක්‍රමවේදයක් ඇති මට ඒක සම්බන්ධ කරලා දෙන්න පුළුවන්. මගේ ඉල්ලීම තියෙන්නේ ටවුන් එකේ සිට ප්‍රදේශීය ලේකම් කාර්යාලය දක්වා නල පද්ධති දෙකක් හෝ තුනක් ස්ථාපිත කරන්න කියලා. ඉතින් මොහාන් මන්ත්‍රීතුමා ගෙනාපු ඒ යෝජනාව ඉතාම හොඳයි. ඒවගේම මේ සම්බන්ධයෙන් ඔබතුමාලා සමඟින් අශෝක මන්ත්‍රීතුමා මැදිහත් වෙලා සංවර්ධන කමිටුවේදී යෝජනා කරලත් තියනවා. බොහොම ස්තූතියි

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මොහාන් මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අත්‍යාවශ්‍ය යෝජනාවක්. ඒ යෝජනාව සමඟ උද්ධාල මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවත් අත්‍යාවශ්‍යයි. මහරච්චිමුල්ල සහ බෝයවලාන නගරත් සීඝ්‍රයෙන් දියුණු වෙන නිසා එම යෝජනාවත් ක්‍රියාත්මක කරනවා නම් හොඳයි. ඒවගේම පසුගිය දෙවනිදා මම අලව්ව නගරයට ත්‍රීවීල් එකක ආවා. හවස 1.30 – 1.45 අතර, එවෙලාවේ රේල් පාර මැද්දේ වෑන් එකක් ආවා ඒ එනකොට ඉස්සර සුමනගිරිය තිබ්බේ ඒ හරියේදී පාසල් ළමයෙක් මම ආපු ත්‍රීවිල් එක දෙසටම ඉක්මනට පැන්නා. ත්‍රීවිල් එකේ රියදුරුගේ දක්ෂකම නිසා පාසල් ළමයා රෝහලට නොයා බේරුණා. ඒක නිසා ගරු සභාපතිතුමනි, අයිලන්ඩ් එක දාන එක බොහෝම හොඳයි කියලා යෝජනා කරනවා. අනතුරු බොහෝම වැඩියි ඒ නිසා ඒ ගැන කාරුණිකව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා, අපි සයලු දෙනාම අලව්ව නගරයේ සිදු වෙන්නේ මොකක්ද කියලා දැන ගැනීම අවශ්‍යයි. අපි කිසිසේත් අයිලන්ඩ් එක දාන් නැහැ කියලා තීන්දුවක් අරගෙන නැහැ. ඒ සම්බන්ධයෙන්ස සමාජ මාධ්‍ය තුළ එක එක්කෙනා හදන මතයක්. අලව්ව නගරය කේන්ද්‍ර කරගත්තහම දුම්රියපොල තිබෙන ස්ථානයේ අඹගස් වීදිය පාර තියනවා එතන අනිවාර්යෙන්ම දෙපැත්තෙන්ම අයිලන්ඩ් එක තියනවා. අඹග්ස වීදිය පාරෙන් වාහන දාන්න ඕනි නිසා HNB බැංකුව ළඟට එනකල් දෙපැත්තේම අයිලන්ඩ් එක තියනවා. ඊටපස්සේ HNB එක හරියේ පදික මංතීරුවක් තියෙන්න ඕනි. නැවත හරවා ගැනීමේ අවකාශය දීම සඳහා යූ ටර්න් ගහන්න අවශ්‍යයි. ඒ අනුව, පදික මංතීරුවකට, යූ ටර්න් එකකට ඉඩ දෙන්න ඕනි. ඒවගේම ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන බැංකු සියල්ලම ඉදිරිපිට පදික මංතීරුවක් දෙන්න ඕනි. ඊටපස්සේ මොහාන් මන්ත්‍රීතුමාගේ කඩේ ළඟින් දුම්රිය හරස් මාර්ගයෙන් එන වාහනවලට ප්‍රවේශ මාර්ගයක් දෙන්නත් ඕනි. ඉදිරියේ බස් නැවතුම්පලටත් හැරෙන තැන සරසවි හෝටලයට එහා පැත්තෙන් සහ මෙහා පැත්තෙන් අනිවාර්යෙන් පදික මංතීරුවක් දෙන්න ඕනි. කාගීල්ස් ෆුඩ් සිටි එක පසුකර නාරම්මල පාරට යන්න ඕනි ඒ නිසා දිස්නා පොත්හල අසලින් ආයෙත් පදික මංතීරුවක් දෙන්න ඕනි. ඔය කියන අයිලන්ඩ් එක ලොකු ප්‍රමාණයක් නැහැනේ. දිස්නා පොත්හල අතර යම් ප්‍රමාණයක අයිලන්ඩ් එකක් දෙන්න පුළුවන්. ඊට පස්සේ පියසෙවන කඩේ සහ කොස්ගහමුල කඩේ අසලට සහ බැංකු ළඟ සිට HNB එක ළඟට පොඩි අයිලන්ඩ් කොටසක් එනවා. ඕක තමා නගරය.

ගිරිඋල්ල සහ නාරම්මල පාරට වෙනම පදික මංතීරු පාර හරහා හැදෙනවා. මම කියන තාක්ෂණික කාරණා ටික හරියට බලලා තමා සංවර්ධන කටයුතු අවසන් වීමට පෙර අයිලන්ඩ් එක දාන්නේ කොතනද කියන එක තීරණය කරන්න වෙන්නේ. ඊට අමතරව ගස් ටික සිටවලා තියන තැන්වල කැටගල් පේළියක් සමඟ ගාර්ඩ් එකක් හදන්න තියනවා. පාර දෙපැත්තේ පාර්කින් දෙන්න ඕනි. මේ සියලු කාරණා සමඟ අපිට කරගන්න පුළුවන් වෙයි. වෙන නගරවල අඩි 50ට ,අලව්ව නගරය අඩි 40කට කඩලා තියෙන්නේ. කැටගල් ප්‍රශ්නයක් තියනවා. කාපට් එක නවන්න කීවේ කාණුවට කෙලින්ම වතුර පාර යන්න. ඊට එකඟතාවය තාම ඇවිත් නැහැ. ඒ නිසා මේ දවස්වල එම කටයුතු පහුවෙලත් තියනවා. දුම්රිය දෙපාර්තමේන්තුවේ විදුලි කණු 02 ඉවත්කරලා දෙන් නැති එකත් එක්ක අනතුරු තත්වයේ කාලයත් ඇදෙනවනේ. මාර්ග සංවර්ධන අධිකාරියත් සමඟ සාකච්ඡා කරලා මේ ගැටලු ටික නිරවුල් කරගන්න ඕනි. ඒ නිසා කවුරුත් වැරදි අවබෝධයක් ගන්න එපා. මොනදේ කළත් අපි මහජනතාව වෙනුවෙන් ඕනිම සංවිධානයක් එක්ක කතා කරනවා. ත්‍රීවීල් සංගමයේ, වෙළඳ සංගමයේ මොනවා හරි ප්‍රශ්නයක් කීවොත් අපි මැදිහත් වෙලා කතා කරනවා. නමුත් තීන්දු තීරණ ගැනීමේදී ඒ සියලු දෙනාටම ඇහුම්කම් දීලා නිවැරදි දේ කරන්නනේ අපි ඉන්නේ. ඒ නිසා කවුරුත් වැරදි අර්ථ කථන දෙන්න යන්න එපා. නගරයේ ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් නිවැරදි තීන්දුව අලව්ව ප්‍රාදේශීය සභාව විදිහට අපි ගන්නවා කියන එකට අපි සියලු දෙනා පෙනී සිටිය යුතුයි.

ඒ අනුව පසුගිය සංවර්ධන කමිටුවේදී අලව්ව ප්‍රදේශය භාර ජල සම්පත් මණ්ඩලයේ නිලධාරීතුමා විසින් සිදුකළ ඉල්ලීම පරිදි ජල සම්පත් මණ්ඩලය සඳහා හයිඩ්‍රන් ජලනල පද්ධතියක් ලබා දීම සුදුසු බවට මහසභාවේ අනුමැතිය දන්වා එම ආයතනයට ලිපියක් යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05.3)<u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/05/06/03 දරණ යෝජනාව</u>**

සාමාන්‍ය ලංසු ඇගයීම් කමිටු සමාජිකයින් ලෙස පහත සඳහන් නිලධාරීන් පත් කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| නිලධාරි | සේවා ආයතනය |
|---|---|
| එස්.එන්.බී.ඩබ්.එම්.ඩී.ජී.වඩිනමුණ මහතා (කමිටු සභාපති) -නිර්මාණ වැඩ අධිකාරී | පළාත් පාලන දෙපාර්තමේන්තුව |
| වයි.එම්.එම්.ටී.බී. උඩවෙල මහතා (කමිටු සාමාජික) - වැඩ අධිකාරී | අලව්ව ප්‍රාදේශීය සභාව |
| ආර්.එම්.ඒ.රණසිංහ මිය (කමිටු සාමාජික) - ආදායම් ප්‍රවර්ධන නිලධාරී | අලව්ව ප්‍රාදේශීය සභාව |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, සාමාන්‍ය ලංසු ඇගයීම් කමිටු සමාජිකයින් ලෙස ඉහත සඳහන් නිලධාරීන් පත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05.4)<u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/05/06/04 දරණ යෝජනාව</u>**

2026 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාව සඳහා වැඩ, සැපයුම් හා සේවා සඳහා අවශ්‍ය සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා වන පුවත්පත් දැන්වීම සිංහල භාෂාවෙන් දිනමිණ පුවත්පතේ ද, දමිළ භාෂාවෙන් තිනකරන් පුවත්පතේ ද පල කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවටත්, එකී දැන්වීමට අදාල උධෘත සමඟින් බිල්පත් අප වෙත ඉදිරිපත් කළ පසු දැන්වීම් ප්‍රදර්ශන ගාස්තු ගෙවීම සඳහා ද අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. චමින්ද මාල් මැතිතුමා**
සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව,2026 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාව සඳහා වැඩ, සැපයුම් හා සේවා සඳහා අවශ්‍ය සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා වන පුවත්පත් දැන්වීම සිංහල භාෂාවෙන් දිනමිණ පුවත්පතේ ද, දමිළ භාෂාවෙන් තිනකරන් පුවත්පතේ ද පල කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවටත්, එකී දැන්වීමට අදාල උධෘත සමඟින් බිල්පත් අප වෙත ඉදිරිපත් කළ පසු දැන්වීම් ප්‍රදර්ශන ගාස්තු ගෙවීම සඳහා ද අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**(05.5) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව - අංක 07/05/06/05 දරණ යෝජනාව**

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාමීයව පවත්වාගෙන යනු ලබන සුසාන භූමි අතරින් බහුතරයක් සුසාන භූමි වර්තමානය වන විට නිසිලෙස නඩත්තු නොවීම හේතුවෙන් භාවිතයට ගැනීමට අපහසු තත්වයක් පවතින බවත්, ග්‍රාමීය ජනතාව විවිධ වූ අපහසුතාවයන්ට මුහුණ පෑමට සිදුව තිබේ. එසේම බොහොමයක් සුසාන භූමි නිරීක්ෂණය කිරීමේදී පහත සඳහන් කරුණු මෙම තත්වයට සෘජුව බලපා ඇති බව පෙනී යයි.

(අ.) සුසාන භූමිවලට ප්‍රවේශ මාර්ග නිසි ලෙස නඩත්තු නොවීම හා නීත්‍යානුකූල ලෙස මාර්ග නොමැති වීම සහ නිසි ලෙස නඩත්තු නොවීම.

(ආ) සුසාන භූමි දීර්ඝ කාලයක සිට නඩත්තු නොකිරීම හේතුවෙන් විශාල ලෙස ගස් ගල් පැවතීම නිසා භාවිතයට ගැනීමට හැකි භූමි ප්‍රමාණයක් සීමිත නොවීම.

ඉහත සඳහන් කුරුණු හේතුවෙන් අලව්ව ප්‍රාදේශීය බල ප්‍රදේශයට අයත් ග්‍රාමීය ජනතාවට සුසාන භූමි සම්බන්ධයෙන් මුහුණ දීමට සිදුව ඇති ගැටලුවලින් මුදා ගැනීම සඳහා මෙම සුසානභූමි සංවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය කරුණක් වේ. එබැවින් සුසාන භූමි ආඥා පනතේ 5 වන වගන්තියේ 1 හා 3 යන උප වගන්ති ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සුසාන භූමි යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් සංවර්ධනය කර භාවිතයට සුදුසු ලෙස සකස් කර දීමට අවශ්‍ය විශේෂ අනුමැතියන් පළාත් පාලන කොමසාරිස්තුමියගෙන් හෝ අමාත්‍යවරයාගේ බලතල පැවරී ඇති ආණ්ඩුකාරවරයාගෙන් ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා**
සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කරන්න හේතු වුණේ සුසාන භූමි සම්බන්ධව ගම්වල මිනිස්සු ගොඩාක් අපහසුතාවයට පත්වෙන නිසයි. මේවා දිගින් දිගටම තියන ප්‍රශ්න. සුසාන භූමිවලට ප්‍රවේශ වන මාර්ග නීත්‍යානුකූලව විසඳිලා නැහැ. සුසාන භූමි ඇතුළට යන්න පාරවල් නැහැ. සුසාන භූමිවල විශාල ගස් වැවිලා තියනවා. ගල් තියනවා. අපිට තියන අත්දැකීම තමා දේහයක් මිහිදන් කරන්න ගිහාම එකම තැනක වලවල් හාරන්න වෙන්නේ, සමහර වෙලාවට තව මිනියක කොටසක් හම්බ වෙනවා. ඒක ගොඩ දාලා තමා ආයේ මිහිදන් කරන්නේ. සුසාන භූමි සම්බන්ධව නීතිමය ප්‍රශ්න තියනවා කියනවා. නමුත් ඒ සුසාන භූමිවල දේහයන් මිහිදන් කරන්නේ ගමේම අය ඔවුන් කිසිම අවස්ථාවක නීතිමය පැත්තකට ගිහිල්ලා නැහැ. හැම අවස්ථාවකම ඔවුන්ට තියන අපහසුතා තමා ඔවුන් කියන්නේ. අලව්ව ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තියේ "සියලු පහසුකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම" ලෙස පැහැදිලිව සඳහන් වෙනවා. මෙතනදී සියලුම පහසුකම් කියන්නේ අත්‍යාවශ්‍ය මූලික අවශ්‍යතා හැරුණාම තම දේහයන් මිහිදන් කර ගැනීම වැනි මූලික අවශ්‍යතාවයන්. එතනදී ජනතාවගේ හඬට ඇහුම්කම් නොදී කිසිම අවස්ථාවක නීතිමය ප්‍රශ්න විසඳා නොගෙන නීතිමය ප්‍රශ්න තියනවා කියන එක නෙවේ සභාවේ වගකීම. ඒවගේම සුසාන භූමි ආඥා පනතේ 5(1) යටතේ "මළවුන් වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස පොදු සුසානයක් පිහිටුවීමට නියෝගයක් නිකුත් කළ හැකිය. ඒසේම ඒ ආකාරයෙන් ම නිකුත් කරනු ලබන නියෝගයක් මඟින් මීට පෙර පිහිටුවන ලද හෝ මෙයින් පසුව පිහිටුවන ලද සුසානයක භූමි ප්‍රමාණය වැඩි කිරීමට, අඩු කිරීමට හෝ වෙනත් ආකාරයකින් වෙනස් කිරීමට අමාත්‍යවරයාට හැකි ය." යනුවෙන් එම වගන්තිය හරහා අමාත්‍යවරයාට බලතල තියනවා.

ඒවගේම 5(3) යටතේ "ඊට ප්‍රථමව හෝ පසුව පිහිටුවන ලද කවර හෝ පොදු සුසානයක් වුවද සම්පූර්ණයෙන් හෝ එහි කොටසක්, 10 වන, 15 වන, 16 වන සහ 23 වන වගන්ති සියල්ල ම හෝ ඉන් කිසියම් වගන්තියක් අදාළ නො වන පරිදි නිදහස් කිරීමටත්, එවැනි නිදහස් කිරීමක් කලින් කල ඉවත් කිරීමටත් හෝ සංශෝධනය කිරීමටත් අමාත්‍යවරයාට හැකිය." යන්න සඳහන් වෙනවා. 10,15,16 සහ 23 වගන්තිවල තියෙන්නේ සුසාන භූමි පාලකවරයෙක් පත් කිරීම සම්බන්ධවයි. මෙම වගන්ති හරහා සුසාන භූමි අළුත්වැඩියා කිරීමට අමාත්‍යවරයාට අනුමැතිය ලබා දෙන්න පුළුවන් කියලා අනුමාන කරලා තමා මම මේක ඉදිරිපත් කරන්නේ.

ගමේ මළගෙදරක් වුණාම සමිතියෙන් වලක් කපන්න ගිහාම නොයෙකුත් ප්‍රශ්න එහිදී ඇති වෙනවා. මිනිස්සු මේකේ නීතිමය පැත්ත දන් නැහැ. මේකට බැකෝ, මෝටර් ග්‍රේඩර් දාන්න බැහැ කියලා දන්නැහැ. සුසාන භූමි ආඥා පනතේ එක වගන්තියක පැහැදිලිව තියනවා. සුසානයකට අලාභ හානි සිදු කිරීම, සුසානයක් කීවාහම පොඩි ස්මාරක හදන්නේ. ඒකට අලාභ හානි කිරීම, පෞද්ගලික අලාභ හානි කිරීම, පෞද්ගලික තරහක් නිසා හෝ වෙන යම් ක්‍රමයකට අලාභ හානි කිරීම සඳහා ඒකට මන් හිතන්නේ රු.1500.00 ක් හෝ රු.2000.00ක දඩයකට යටත් කරන්න කියලා ආඥා පනතේ පැහැදිලව තියනවා. දැනට ප්‍රාදේශීය සභාවට සුසාන භූමි පවරා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතිනවා. සුසාන භූමි ආඥා පනතේ පැහැදිලිව තියනවා මේ සම්බන්ධව බල අධිකාරිය පළාත් පාලනය වන්නේය කියලා. එහෙම අණ පනත්, චක්‍රලේඛවලිනුත් දීලා තියෙද්දී සභාවක් විදිහට අපි නිහඬයි. ප්‍රාදේශීය ලේකම් සුසාන භූමි ටික පවරලා දෙන්නෙත් නැහැ. අපි ඒකට උත්සාහ ගන්නෙත් නැහැ. අපි සියලුම ප්‍රදේශයේ ජනතාව නියෝජනය කරන්නේ. ජනතාවගේ ප්‍රශ්නය මෙතනින් හරියට නිරාකරණය වෙන් නැහැ. ගරු සභාපතිතුමනි, පළමු අවශ්‍යතාවය තමා ප්‍රාදේශීය ලේකම් සමඟ සම්බන්ධීකරණය වෙලා සුසාන භූමි ගැසට් කරලා ප්‍රාදේශීය සභාවට පවරා ගන්න එක. ඊළඟට දේහයක් භූමදානය සිදු කළ නොහැකි මට්ටමේ පවතින සුසාන භූමි පිළිබඳව අධ්‍යයනයක් සිදු කළ ඒවා හඳුනා ගනිමින් සංවර්ධනය කරන එක තියෙන්නේ. වැසි කාලවලට සුසාන භූමිවලට මිනියක් අරගෙන යාමට අපහසු මට්ටමේ ප්‍රවේශ මාර්ගයන් තියෙන්නේ. සභාවක් විදිහට මිනිස්සුන්ගේ අවශ්‍යතාවයන් හඳුනා ගනිමින් ඒවාට පිළිතුරු සෙවිය යුතුයි. මෙහි නීතිමය රාමුවක් තියනවා, නීතිමය ප්‍රශ්න තියනවා කියලා අපි නිහඬව ඉන්න එක නෙවේ කළ යුතු වන්නේ. ගරු ආණ්ඩුකාරතුමාට, පළාත් පාලන කොමසාරිස්තුමාට බලය තියනවා අපි ඉල්ලීමක් කරලා ලිඛිත අනුමැතිය යටතේ කටයුතු කරමු. මෙතනදී අපි හිතුමතේට වැඩ කරන්න ගියොත් ලේකම්තුමිය, තාක්ෂණික නිලධාරීතුමා නැත්නම් ගරු සභාපතිතුමාට වගකියන්න වෙන්නේ. අපිට අවශ්‍යතාවය වන්නේ මිනිස්සුන්ට හොඳට සේවය කරන්නයි. ප්‍රාදේශීය සභාව තුළින් ඒ සේවය ලබා දෙන්න නම්, මිනිස්සු තැවෙන ප්‍රශ්නවලට පිළිතුරු සෙවිය යුතුයි. ඒ සඳහා යෝජනා ගේන්න ඕනි. යෝජනා හරහා රජය අවධානයට ලක් කරන්න ඕනි. පළාත් පාලන කොමසාරිස්තුමාගේ සහ ගරු ආණ්ඩුකාරතුමාගේ අවධානයට ලක් කරන්න ඕනි. මේවාට යොමු වෙන් නැතිතාක් මේවාට විසඳුම් සොයන්න බැහැ. ඒ නිසා මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරලා කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කරයි කියලා බලාපොරොත්තු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ආරම්භක සභාවේදී 1991 දී ගාමිණි ගුණදාස කියන ගෞහස්ථ දේශපාලඥයා ප්‍රාදේශීය සභාවේ සභාපති වුණේ. ඒ කාලයේත් සුසාන භූමි සම්බන්ධව කතිකාවතක් ඇති වුණා. අලව්වේ සුළු නගර සභාවේ හිටපු නගරාධිපති වඩුවාවේ කුමාරදාස හේරත් මහතා අපේ හිටපු උප සභාපතිතුමාගේ සහෝදරයෙක්. එයත් සම්බන්ධ කරගනිමින් ගාමිණී ගුණදාස මහතා මේකට යා යුතු ක්‍රමවේදය කුමක්ද යන්න සාකච්ඡා කරා. එතුමා කරන්න අවශ්‍ය දේ පැහැදිලි කරලා කීවා, "මේක සම්බන්ධව නෛතික ප්‍රශ්න තියෙනවා. උපතේ සිටම මරණය දක්වා කටයුතු කරන ප්‍රාදේශීය සභාවක් විදිහට සභාවට පවරා දෙන ලෙස ඒ කාලයේ ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ඉල්ලීම් කරන්න" කියලා. එවකට හිටිය රාජ්‍ය නිලධාරීන් නිසා ඒ කටයුතු ඉටු වුණේ නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේත් මහජන නියෝජිතයන් හිටියා නම් මේක කරනවා මොකද ඔවුන් ගමේ ජනතාවට වගකියන්න වෙන නිසා. ප්‍රාදේශිය සභාවේ ගාමිණි ගුණදාස මහතා එවකට හිටි මන්ත්‍රී මණ්ඩලය සමඟ යෝජනා සම්මත කරලා ගරු ආණ්ඩුකාරතුමාට හා විෂය භාරතුමාට මේ පිළිබඳව අවශ්‍ය කරන පහසුකම් ටික සළසා දීමට කටයතු කරන ලෙසට පළාත් පාලන කොමසාරිස්තුමාට දන්වා ලිපියක් යොමු කරා. නමුත් ඊට පසු කාලයක සුසාන භූමි කිහිපයක් පවරා දුන්නට සියලුම සුසාන භූමි පැවරුවේ නැහැ.

ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා හැටියට කටයුතු කරපු හැම සභාපතිවරයෙක්ම කොන්ද කෙලින් තියාගෙන සුසාන භූමි ආඥා පනත මොකක්ද කින එක තදින් අවබෝධ කරගෙන සුසාන භූමි සම්බන්ධව තීන්දු තීරණ ගන්නකොට ප්‍රාදේශීය ලේකම් සම්බන්ධ වුණේ නැහැ. සුසාන භූමි අයිතිය තියෙන්නේ අපිට නමුත් සුසාන භූමි ටික ඔබට නම්, සුසාන භූමි සංවර්ධනය කරන කටයුත්තත් කරගන්න ,මරණයක් භූමදානය කරන විට ප්‍රශ්නයක් ආවොත් ඒ ටිකත් ඔබලා විසඳ ගන්න කියන තැනට ආවට පස්සේ තමා එයාලා අපෙන් අයින් වෙලා ගියේ. ඒ අතරතුර පන්සලකින් නාරම්මල සභාවට ඉල්ලීමක් ආවා. මේ සභාවේ ඒ කාලයේ හිටපු ලේකම් මහතා වෙන්නොරුවේ. වෙන්නොරුව විහාරස්ථානයේ නායක හාමුදුරුවෝ පන්සලේ බණ මඩුව කඩා වැටිම නිසා සුසාන භූමියට ආදළ කොස් ගහක් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරා. නමුත් එදා සභාවේ සුසාන භූමි ආඥා පනත ගැන මොනවා කතා වුණත් කොස් පැළ 10 ක් හත්අට පේරුවේ දායක සභාවට හදන්න කියලා මාස 06 කින් සභාවේ නිළධාරින් මහත්වරුන්ගේ අධීක්ෂණයකින් පස්සේ මේ කොස් ගහ කපන්න අවසර දෙන්න කියලා සභාවේ ඒකමතික තීන්දුවක් ගත්තා. ප්‍රාදේශීය ලේකම් හැටියට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දිය යුතු සහයෝගය ඒ අවස්ථාවේ ලබා දුන්නා මිසක් කඹ ඇද ඇද හිටියේ නැහැ.

සුසාන භූමි ප්‍රශ්න ආවම එදා ආරම්භක සභාවේ ඉදලා හිටපු සැම සභාපතිවරයෙක්ම, ලේකම් පුටුවේ හිටපු සැම ලේකම්වරයෙක්ම මේ සම්බන්ධව අවශ්‍යා දේ කරා. ඊළඟට ඔබ තුමාටත් මතක ඇති, පත්මා වැත්තැව හිටපු ගරු සභාපතිතුමිය සභාපති පුටුවේ ඉද්දි සුසාන භූමි සංවර්ධන කටයුත්තක් සඳහා රජයේ මුදලක් වෙන් කරනවා කියලා යෝජනාවක් සභාවට ආවා. ඒක අලංකාර කරන්න මල් පැල ගන්න අවශ්‍යායි කීවා. මම මල් පැල හැත්තෑ පහක් ගෙනල්ලා දුන්නා. ගරු සභාපතිතුමනි, මේකේ උපුල් මන්ත්‍රීතුමා කියන දේවල් පිළිබඳව නියමිත ක්‍රමවේදයෙන් තොරව යන්න පුළුවන් තැනක් තියනවා. ප්‍රථමයෙන්ම සුසාන භූමිවලට සම්බන්ධ වෙන මරණාධාර සමිති කීයක් තියනවාද කියලා බලලා ඒ මරණාධාර සමිතිවල මහ සභාවේ ඒකමතික තීන්දුවක් ගන්න ඕනි. සුසාන භූමි වල් වැදිලා තියෙන්නේ. ඒනිසා සුසාන භූමි සුද්ද කරලා ක්‍රමවත්ව සකස්කරලා දෙන්න කියලා ඉල්ලීමක් මහ සභාවේ සම්මත වෙලා ගරු සභාපතිතුමාගේ යෝජනාවක් හැටියක එන්න ඕනි. අන්න ඒ යෝජනාවලිය එකට එකතු කරලා තමා කරන්න පුළුවන් වෙන්නේ. විධිමත් විදියට වැඩපිළිවෙලක් සකස් කරලා තිබුණා නම් පිට්ටනිය ලස්සනට තියෙනවා නම් ඕනම කෙනෙක් කැමති තමන්ගෙ දේහය ගිහිල්ලා වලලගන්න. ඒකට යන වියදමත් අවමයි. ඒ නිසා කිසිම අකමැත්තකින් තොරව එතෙන්ට ජනතාව ඒකරාශී වෙනවා. ප්‍රදේශයේ මහජන නියෝජිතයෝ හැටියට, අපි ඡන්දවලට ඉදිරිපත් වෙනකොට ඡන්ද දායකයෝ විශේෂයෙන් මරණාධාර සමිතිවල නිලධාරීන් සුසාන භූමි සම්බන්ධව ඉල්ලීම් කරනවා. ඒවෙලාවේ අපි ඉල්ලීම සිදු කරලා දෙන්නම් කියලා කියනවා නමුත් ප්‍රාදේශීය සභා පනත සහ නිලධාරීන් සමඟ ප්‍රශ්නේ ඇති වෙනකොට තමා තේරෙන්නේ අපි ෆේල් කියලා. එවෙලේ ගමේ එකඟ වුණාට පනත් සමඟ අපිට කරගන්න බැරි වෙනවා. ගරු සභාපතිතුමනි, ජනතා පරමාධිපත්‍ය මත තේරී පත් වූ මහජන නියෝජිතයෝ වන අපි ගන්න තීන්දුව මත තමා රාජ්‍ය නිලධාරීන්ගේ සුරක්ෂිතතාවය රැකෙන්නේ. අපි ඒකමතිකව ගන්න තීන්දුව මත තමා අවසානයේ මල්ඵල දරන්නේ. දඹදෙණි ආසනයේ අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සුසාන භූමි විශාල ප්‍රමාණයක් තියෙනවා. එතනින් කිහිපයක් සභාවට පවරලා තියනවා. නමුත් සභාපතිවරයා තම ධූරය දරන අවුරුදු 4/5 ක කාල සීමාව සියලුම සුසාන භූමිවල හිමිකාරිත්වය ලැබෙන අතර, ඒ සම්බන්ධව නිසි තීන්දු තීරණ ද ගන්න සිදුවෙනවා. ඒනිසා මේ ගෙනාව යෝජනාව හොඳයි. මේකේ නීතිමය පැත්ත ගැන හිතනවද නැතිනම් මහජන නියෝජිතයා හැටියට අපි සියලුම දෙනා එකට එකතු වෙලා අපේ බල ප්‍රදේශයේ සුසාන භූමි ටික සංවර්ධනය කීරිමේ කටයුත්තට දායක වෙනවාද නැත්නම් එක නිලධාරියෙක්ගේ දෙන්නෙක්ගේ අවශ්‍යාතාවය මත නිහඬ වෙන්න අරිනවා ද කියලා හිතන්න. විශේෂයෙන්ම මේ සම්බන්ධව මම නීතිමය පැත්ත ගැනත් කියන්නම්. අලව්ව සුසාන භූමියේ හඳුනා නොගත් මරණ ගෙනල්ලා වළලන එක කොටසක් තියෙනවා. කෝච්චියේ හැප්පෙන්න පුළුවන්, වස බීපු එකක් වෙන්න පුළුවන්. පොලිසිය මරණ අරගන්නවා ඒ මරණය භාරගන්න කෙනෙක් නැහැ. ඒ මරණ වළලනකොට මහේස්ත්‍රාත් තුමා, ගමේ ඉන්න මහේස්ත්‍රාත් හැටියට හදිසි මරණ පරීක්ෂණතුමා තීන්දු දෙනවා, උසාවියෙන් තීන්දුවක් දෙනවා අවශ්‍යා වූ මොහොත ගොඩ ගැනීමට සුදුසු ස්ථානයක මිහිදන් කරන්න කියලා. ඒ අනුව තමා වළදාන්නේ. මෙතන එන නෛතික ප්‍රශ්නෙ තමා, ප්‍රශ්නයකදී වළලපු මිනිය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ආවොත් ඒකට රාජ්‍ය නිලධාරීන් වගකියන්න ඕනි.

ඒනිසා මම ඒ සම්බන්ධව පොලිසියත් එක්ක කතා කරාම කීවේ මේ ප්‍රශ්න අදාල මිනී කොනක වළලලා තියෙන්නේ ඒ නිසා අනිත් සියල්ලම සංවර්ධනය කීරිමට අපෙන් බාධාවක් නැහැ කියලා. එවකට හිටපු ස්ථානාධිපතිතුමා කීවා මරණධාර සමිති ටිකේ ඉල්ලීම් ලිපි ටික ගන්න මේකට විරුද්ධ විය හැක්කේ මරණධාර සමිති ටික විතරයි කියලා. ඒ ලියුම් ටිකත් එක්ක සංවර්ධන කටයුත්තට යන්න කීවා. මෙය විය යුත්තක් සේ එදත් සලකනවා අදත් සලකනවා. කටයුත්ත සාධාරණ නම්, විය යුත්තේ සමාජයට යහපතක් නම්, එය වෙනුවෙන් පක්ෂයක්, පාඨයක්, කුලයක්, ආගමක්ද නොව අපේ වගකිමක වෙන්නේ අප සියල්ල එකට එකතු වී ගන්න සාමුහික තීන්දුව කියන එක මම ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**
ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව සම්බන්ධයෙන් මටත් අදහසක් ප්‍රකාශ කරන්න හිතුණා. සභාවට මෙහෙම යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. අපේ කොට්ඨාසය ගත්තොත් මගේ ගම ගල්ගමුවේ කැබැල්ලවිට ඒ ගම ගත්තොත් ඔබ තුමාන් දන්නවා. බොහෝ වෙලාවට මිනී ටික වළලන්නේ එකම ස්ථානයක. සුසාන භූමියේ පිටුපස්සට වෙන්න කිසිම කටයුත්තක් සිද්ධ වෙන්නෙ නැහැ. ඇයි අහපුවහම කියන්නේ, ගල් මුල් නිසා වල කපන්න අපහසුයි කියන එක. සුසාන භූමියේ විවිධ ශරීර කොටස් හම්බවෙනකොට හරිම දුක හිතෙනවා. ඒ නිසා ඒකත් මතක් කරන ගමන්ම, මෙම යෝජනාවේ තියනවා ප්‍රවේශ මාර්ග නොමැති වීම සම්බන්ධව. මිරිහෙලිය සුසාන භූමිය රේල් පාර අද්දර තියෙන්නේ. ඒකටත් හොඳ ප්‍රවේශ මාර්ගයක් නැහැ. සමහර වෙලාවට මන්ත්‍රීතුමාලා කැන්වසින් යනකොටත් දකිනවා ඇති, අපි යන්නේ සුසාන භූමියෙන්ද ගෙවල් අතරින්ද යන්න සොයා ගැනිමට නොහැකි මට්ටමටම ප්‍රවේශ මාර්ගය නැති වී තියෙනවා. ඒවගේම පරමාඋල්ලට අයිති කිරිදිවැල්ලගොල්ල සුසාන භූමිය තුළත් වල් බිහි වී තියෙනවා. මම දැක්කා දේහයක් මිහිදන් කරන්න වල කපනවා, වල කපන පිරිසටත් පේන්නෙ නැති විදියට වටේ කැලෑව වැහිලා. ඒ ටික සුද්ද කර නොගැනීම මිනිස්සුගේත් අඩුපාඩුවක්. ඒවගේ ස්ථාන රාශියක් තියෙනවා ඒ නිසා හොඳ යෝජනාවක් ඉදිරිපත් වුණා. නීතිමය තත්වය පිළිබඳව අපි කතා කරා. ඒ නිසා මෙම යෝජනාව නිසි පරිදි ක්‍රියාත්මක කරන තැනකට ගේන්න සභාවක් හැටියට අපි කටයුතු කරමු කියලා ඉල්ලා සිටිමින් නිහඬ වෙනවා ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ප්‍රියන්ත මන්ත්‍රිතුමා කරපු යෝජනාව කාලීන යෝජනාවක්. සුසාන භූමිවලට යන මාර්ග බොහොම අබලන් තත්ත්වයේ තියෙන්නේ. යන්න බැහැ. මමයි මොහාන් මන්ත්‍රීතුමායි වෙන්නොරුවේ මළගෙවල් කිහිපයකට ගියා. ඒ පාරේ යන්න අපහසුයි, එතන කොස් ගහක් අල්ලගෙන තමා යන්න ඕනි. ඉල්ලීමකුත් කරා, ඒ පාර කපලා දෙන්න කියලා මෙතුමාගේ යෝජනාවේ මාර්ග සංවර්ධනය පිළිබඳව දාලා තිබ්බා. ඒ නිසා වෙන්නොරුවේ සුසාන භූමියට යන මාර්ගය කොන්ක්‍රීට් තට්ටුවක් දාලා සකස් කරලා දෙනවා නම් හෝ කොන්ක්‍රීට් දාලා පාර හදලා දෙනවා නම් ඒ ජනතාවට ලොකු සහනයක්. මට මතකයි ප්‍රාදේශිය සභාව නාරම්මල තියෙන කොට එතන රජයේ වෙන් කරපු කොටසක සුසාන භූමියක් තියනවා. ඒ ඉඩමේ ගෙයක් ළඟ මිනියක් වැලලුවා. ඒ ගෙයි පිළිකන්නේ තමා මිනිය වැළලුවේ. ඒකට ප්‍රාදේශීය සභාවට චෝදනා කරා. නුංගමුවේ පොඩි මහත්තයා කියලා කෙනෙකුයි, මහරච්චිමුල්ලේ තාක්ෂණික නිලධාරී මහත්තයයි අපි තුන්දෙනා එතනට ආවා. අපි සුසාන භූමිය මැන්නා. මීට පස්සේ ගෙවල් අයිනේ මිනී වළලන්න එපා කීවා. ඒ කට්ටියට කැල්ල වෙන් කළා. සුසාන භූමිය අවට ගෙවල් හතක් අටක් විතර තියෙනවා. මාර්ගයේ ප්‍රශ්නය නිසා කන්ද උඩට මේ කට්ටියට ගෙනියන්නත් බැහැ, ඉඩමේ ප්‍රශ්නය නිසා මලසිරුර භූමදානය කරන එක නැවැත්තුවා. මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට මම නැවත වරක් ස්තුතිවන්ත වෙනවා. සුසාන භූමිවලට යන මාර්ග හදලා දෙන්න ඕනි. ඒනිසා වෙන්නොරුවේ සුසාන භූමියට යන මාර්ගය මහජනතාවට පහසුවෙන් ගමන් කළ හැකි අයුරින් සකස් කරලා දීම සඳහා කාරුණිකව අවධානය යොමු කරලා ඊට අදාල මහ සභා අනුමැතියක් ලබා ගනිමින් සිදු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ප්‍රියන්ත මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවටත්, මොහාන් වික්‍රමනායක මන්ත්‍රීතුමා මෙම ක්‍රියාවලිය කරගෙන යනකොට ඉදිරිපත් වන බාධක සහ නීතිමය පසුබිම පැහැදිලි කිරීම සම්බන්ධයෙන්ද ස්තුතිවන්ත වෙනවා. මම මේකට උදාහරණ 2ක් කියන්නම් මාසයකට විතර පෙර ඉඹුල්ගොඩ සුසාන භූමියට අල්ලපු වතු දෙකකට උඩින් මළගෙයක් තියෙද්දී, ඒ සුසාන භූමිය ළඟ තියන ඉඩමේ හිමිකරු ඊට ප්‍රවේශ වෙන මාර්ගය වහනවා.

ඊට හේතුව තමා සුසාන භූමියට උතුරු දෙසින් තිබ්බ ඉඩමේ අයිතිකාර මහතා නැති වුණාට පසු බිරිඳ තම දරු දෙදෙනාට ඉඩම දෙන්න මනිනවා. ඒ ඉඩම මනිද්දී සුසාන භූමිය පැත්තට කොටසක් අයින් වෙනවා. අනිත් වතු හිමියා ඒ කොටස සුසාන භූමියට යන පාර කියලා තීරණය කරලා පාර වහනවා. ගමේ ජනතාව සමඟ ප්‍රජා කටයුතුවල නියැලෙන නිසා මටත් ඒ ප්‍රශ්නය කීවාහම මමත් මැදිහත් වුණා. එවෙලෙහි අපිත් දැනන් හිටියේ ප්‍රාදේශිය සභාවට තමා සුසාන භූමිය අයිති කියලා. එවෙලෙම වැඩ පරික්ෂක මහතා මෙම සුසාන භූමිය ගිහින් බලලා ප්‍රාදේශිය සභා වටනැහැ කීවා. එතන ගැටුම් ඇති වෙලා අපිට බේරගන්න බැරි වුණා. පොලීසියෙන් ආවා. එතනදී අල්ලපු ඉඩමක් කඩපු එකට ගම් සැලැස්මක් අරන් ආවා, ඒකේ අලුතින් ඉඩමේ සළකුණු කරපු එකේ පාර තියෙනවා. මම ඒ ගැන සභාවට ගිහින් හරය හොයලා බැලුවහම, දැනට අවුරුදු 100 කට පෙර ගමේ හිටපු ගොවි මහතෙක් පොදු සුසාන භූමියකට කියලා පරිත්‍යාග කරලා තියනවා. මම ඒක කැප්පිටිවාලාන උප කාර්යාලයට ගිගින් බැලුවහම ඒක ලැයිස්තුගත වෙලා තියනවා. ගරු සභාපතිතුමනි මම ඉල්ලීමක් කරනවා, උප කාර්යාලවල ලැයිස්තුගත වෙලා තිබෙන ඒවා ප්‍රධාන කාර්යාලයේත් ලැයිස්තුගත වෙලා තිබුණා නම් එදා වැඩ පරීක්ෂක මහතා සුසානභූමිය සභාවට නැහැ කියලා කියන් නැහැ. ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. හෙණ්ඩුවාවේ මල ගෙදරක් වෙලා තිබුණා කැන්දගොල්ල, හෙණ්ඩුවාව දෙකටම එක සුසාන භූමියයි තියෙන්නේ. ඒකෙත් මාන වැවිලා තිබ්බා. ඒකට බැකෝ එක අරන් ගිහාම ග්‍රාම නිලධාරිතුමිය බැකෝ දාන්න බැහැ කියලා විරුද්ධ වෙලා තිබ්බා. ප්‍රාදේහීය සභාවට අයිතිද යන වගට ලිපියක් අරන් එන්න කීවා. එතන ප්‍රජාව මට කතා කළා. ඒවෙලාවෙහි සුසාන භූමියේ වල කපන තැන පමණක් සුද්ද කරන කල් ඉදලා මළගෙදරටත් සහභාගී වෙලා ආවා. මෙම යෝජනාව කාලෝචිත යෝජනාවක්. ඒ නිසා උප කාර්යාලවල ලැයිස්තුගත වෙලා තියන සුසාන භූමි පිළිබඳව ප්‍රධාන කාර්යාලයට අරගෙන ඒවා විධිමත්ව ලැයිස්තුගත කරන්න සැලසුම් කරමුයි කියලා යෝජනා කරමින් ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමින් නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ප්‍රියන්ත උපුල් කුමාර මන්ත්‍රීතුමා මගේ කොට්ඨාසයට හොඳ යෝජනාවක් ගෙනාවා. එතුමා මේක නිවැරදිව අවබෝධ කරගෙන යම් කාරණයක් ඉදිරිපත් කිරීම සම්බන්ධව සන්තෝස වෙනවා. යටිගල්ඔළුවේ මරණාධාර සමිතියේ ලේකම්තුමා හමුවෙලා මට කීවා, අපේ ප්‍රදේශයේ යාන්ගල්මෝදර - මොරවලපිටිය පාරේ සුසාන භූමිය ඩෝසර් කරලා හදන්න ගත්තහම විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් දැඩි විරෝධයක් දක්වලා තියනවා කීවා. එවෙලෙහි විපක්ෂයේ මන්ත්‍රීතුමා මම. ඒ විරෝධය මගේ කියලා කීවා. ඕනම තැනක ඕනම දෙයක් කියන්න කොන්දක් තියෙනවා. එදා කමිටුවේදීත් විරුද්ධ වුණා. විරුද්ධ වෙන්න හේතුවක් තිබ්බා. මේ සභාවේ කතා කරන් යනකොට නීත්‍යානුකූල පැත්ත ගැන කතා කළා. අපේ මන්ත්‍රීතුමන්ලාගෙන් එකපාර අදහසක් ආවා නීතියත් සමඟ ගලපගෙන යන්න ඕනි කියලා. ඒ හින්දා ප්‍රාදේශීය සභාවේ වැඩ ටික යනකොට ප්‍රාදේශීය සභාවේ අණපනත්වල මොන කතා තිබ්බත් මේ පනත යම් යම් තැන්වල ගැටෙනවා. වෙනත් ආයතනවල නීති රීති එක්ක ගැටෙනවා. එදා සම්බන්ධීකරණ කමිටුවේදී අතුකෝරල මන්ත්‍රීතුමා සුසාන භූමියේ කපලා දාලා තියන ගහක් පන්සලේ පොදු කටයුතු සඳහා දෙන්න ඉල්ලනවා. ඒත් ඒ ඉල්ලීම ඉටු කරන්න බැහැ කියනවා. එතන අශෝක ගුණසේන මැතිතුමත් සභාපති වශයෙන් සම්බන්ධීකරණ කමිටුවේ ඉන්නවා. ගරු සභාපතිතුමා සම්බන්ධීකරණ කමිටුවේදී සභාවට සුසාන භූමි සම්බන්ධව බලය තියන බවත්, ඊට අදාල තීන්දු තීරණ ගන්න ප්‍රාදේශීය සභාවට අයිතිය තියෙන්නෙත් කියලා කියන්නේ නැහැ. ඒ නිසා ප්‍රාදේශීය ලේකම්තුමිය ක්‍රියාත්මක කරන නීතිය ඒ ආකාරයෙන්ම සම්මත වෙනවා. නීත්‍යානුකූලව පනත ඇතුළේ මේ සුසාන භූමි අපිට තියනවා නම්, පරම අයිතිකරු අපි නම් ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් ඇයි අපි ගහ දෙන්න අහන්නේ. ගරු සභාපතිතුමාගෙන් ඒ ඉල්ලීම කරන්න ඕනි. පනත ඇතුළේ අර්ථකතනය කරන කාරණා යම් යම් ආයතනත් සමඟ ගැටීම් සිද්ධ වෙනවා. ඒකයි සභාපතිතුමා අපි කියන්නේ පනතේ සමහර තැන්වල තියනවා. මෙම ආයතන ටිකෙන් නිර්දේශ අරගෙන ක්‍රියාත්මක කරන්න ඕනි කියලා. එතකොට එදා පස් කපන්න ගිහාම භූවිද්‍යා එකෙ පනතේ දාලා තියෙනවා, පරිසර එකෙත් සහ තව ආයතනවලින් නිර්දෙශ මත පස් කපන්න ඕනි කියලා. අත්දැකීම් එක්ක කියන්නේ. සුසාන භූමියක් බෝවල ඩෝසර් කරා. මම විරුද්ධ වුණ හේතු කියන්නේ. එවකට හිටිය ප්‍රාදේශිය ලේකම්තුමා සහ හිටපු සන්ධ්‍යා සභාපතිතුමා එක්ක ඒ ප්‍රශ්නය විසඳ ගත්තා නැත්තම් උසාවි ගිහිල්ලා දෙන්නටම හිරේ යන්න තමා වෙන්නෙ. ඒ නිසා ගමේ ගිහින් විපක්ෂයේ මන්ත්‍රීතුමා විරුද්ධයි කියලා කියනවා නම්, ඒ හොර දේශපාලනයට මම නැහැ. මම විරුද්ධයි නම් ස්පීකර් දාලා හරි මෙතන කියනවා. ඒක නෙවේ මූලික ප්‍රශ්නය.

ප්‍රියන්ත මන්ත්‍රීතුමා නවක මන්ත්‍රීවරයෙක් හැටියට ආවහම තේරුම් ගන්න. ඔබතුමා මැතිවරණයත් එක්ක ඒ ප්‍රදේශයට විශේෂ පොරොන්දු ගණනාවක් දුන්නා. මේ පාරට සල්ලි අනුමත වෙලා තියෙනවා මැතිවරණය නිසා කරන්න බැහැ කියලා මැතිවරණ වේදිකාවල කීවා. ඊට පසුව මැතිවරණයත් තියලා, ප්‍රාදේශීය සභාවත් මාස ගණනවාක් ගිහාම අපේ සුසාන භූමියට යන පාර කෝ කියලා මිනිස්සු අහනවා. දැන් ඔය ප්‍රශ්න මට ආවේ නැහැනේ. අවුරුදු 23 ක් ගිහිල්ලත් ඔය සුසාන භූමිය හදලා දෙන්න කියලා මට කීවේ නැහැනේ. දැන් මිනිස්සු ප්‍රශ්න අහනකොට ඔබ තුමා එහෙම කියනවා ඒක දේශපාලනයේ හැටි. දැන් ඔබ තුමාගෙන් මිනිස්සු අහනවා කෝ තාර පාර කියලා, කෝ වෙන් වුණු සල්ලි කියලා ඔබ තුමා මේකට පිළියමක් හැටියට ඒ මිනිස්සුගේ විරෝධය මැඩ පවත්වගන්න ඩෝසරයක් දාලා මේක සමනය කරගන්න උත්සාහ කරා. ප්‍රාදේශීය සභාවේ ඩෝසරය අරගෙන සුසාන භූමිය ඩෝසර් කරා ඒකට කමක් නැහැ. ඒක විය යුතුයි. නමුත් නීත්‍යානුකූල පැත්ත පසකලා, ඔබතුමාගේ කටයුත්තට සහයෝගය දෙනකොට ඒක ගමේ වැරදි විදියට පාවිච්චි කරනවා නම්, මම විරුද්ධයි කියලා කීවත් කමක් නැහැ. ඒක තේරුම් ගන්න. අනික සුසාන භූමි තියෙන්නේ දෙකයි. අපේ ප්‍රදේශයේ යටිගල්ඔළුව කැත්තකොටුව සුසාන භූමියත්, කහවත්ත සුසාන භූමියත් තියෙන්නේ. තව අවුරුදු 10 කින් කහවත්ත මිනි වළලන්නේ නැහැනේ. තව අවුරුදු 10 කින් සභාපති තුමනි කහවත්ත සුසාන භූමියේ කතාව ඉවරයි. ඒ ඒ නායකත්වය අරගෙන ඒ කටයුතු කරපු මිනිස්සුගේ ප්‍රතිඵල. කහවත්ත සුසාන භූමියට වැස්ස දවසකට මිනියක් අරන් යන්න බැහැ. මේ පිළිබඳව තීන්දු තීරණ ගන්න නායකයන්ට කීවා. ගරු සභාපතිතුමනි, තීන්දු තීරණ අරගෙන පහල තිබුණු කනත්ත කන්ද මුදුනට ගෙනියන්න තීන්දු කරපු අයට මිනිය එතන තියලා ගෙනියන්න දෙන්න කීවා. තීන්දු ගත්ත නායකයින්ට පහළ කනත්ත නීත්‍යානුකූලව විසඳීලා ඉවරයක් නැත්නම්, ඒ සඳහා පර්චස් 40 ක් ඇවිල්ලා නම් තියෙන්නේ මේ තැන්නේ මිනිය වලලන්න ඒක ඒ පැත්තක් එක්ක සාකච්ඡා කරලා ප්‍රශ්නය විසඳා ගන්නවා ඇරෙන්න ආයේ ආපහු රට ආපස්සට යනවා වගේ අර කඳු මුදුනකට ගිහිල්ලා මිනී වලලන්න පුළුවන්ද? උණ ගහේ බැදලා මිනි ගෙනියන්නේ , එහෙම දැකලා තමා පහලට කනත්ත ගන්න කටයුතු කළේ. මන් කියන්නේ ඒවා ඔබතුමාලා ගිහින් බලන්න. පහල වලලන්න ඉඩ මදිනම්, ගලක් තියෙනවා නම් එතකොට මේක විසඳලානේ ගන්න ඕනි. පර්චස් එකසිය ගාණක් තියනවා කියලා කන්ද උඩට ආපහු ගියා. පර්චස් 56යි තියෙන්නේ. ආපහු අර මිනිහාගේ ඉඩමේ තමා මිනී වළලා තියෙන්නේ. වැරදි කෝණෙන් බලනවා නම්, වැරදි විදිහට හිතා ගන්න ඒක මට ප්‍රශ්නයක් නැහැ. හැබැයි තීන්දු තීරණ ගන්න කොට හරියට ගන්න ඕනි. තීන්දුවක් ගන්නකොට ජනතාව වැරදි තැනක ඉන්න පුළුවන්. හැබැයි අපි තමා නායකයෝ කියලා කියන්නේ. ඒ නිසා ජනතාව වැරදි තැනක ඉන්නවා නම්, තීන්දු තීරණයක් ගන්කොට මේක වැරදි, හරි දේ කරමු කියලා ඔවුන්ට අදහසක් දෙන්න ඕනි. ඒක තමා නායකත්වය කියලා කියන්නේ. ඒ නිසා තව කාලයක් කහවත්තේ මිනී වළලයි. එතනින් පස්සේ පොල්ගහවෙල ආදාහනාගාරයට අරන් යනවා ඇරෙන්න මිනිස්සු මිනී කරගහන් යන් නැහැ. ඒක නිසා තේරුම් ගන්න. මේක යන්න පුළුවන් ක්‍රමවේදයකට ගිහිල්ලා ගරු සභාපතිතුමනි, සුසාන භූමි සම්බන්ධව නීති අණ පනත් හදනකොට කැත්තකොටුව හා කහවත්ත සුසාන භූමි නැත්තම් මෙහෙ තියන තවත් සුසාන භූමි සම්බන්ධව පමණක් නීති හදලා නැහැ, සමස්ථ රටේ සුසාන භූමි ගැන හිතලා නීතියක් නිර්මාණය වෙන්නේ. යම් යම් අර්බුදකාරී තත්වයන් එනවා. තව යෝජනාවක් ආවා සුසාන භූමියක පාර හදන්න කියලා. පරක් හදන්න මේකේ ඇතුළත් කරගන්න ඕනි නැහැ. පාර හදන්න ප්‍රශ්නයක් නැහැ. සුසාන භූමියේ වැට ගහගන්න ප්‍රශ්නයක් නැහැ සභාපතිතුමනි. සුසාන භූමියේ අසලින් ගෙයක් හදන්න ප්‍රශ්නයක් නැහැ. අපි මේ කතා කරලා තියන සුසාන භූමිය ඩෝසරයක් දාලා ඩෝසර් කිරීම සම්බන්ධව විතරයි අපි විරුද්ධ වුණේ. ඒ හින්දා අපි කියන හැම එකම දේශපාලන කෝණෙකින් බලලා පාට කණ්ණාඩියෙන් බලලා අපි කියන්නේ නිවැරදි එක කියලා පාඩුවේ ඉන්න තිබුණා. ඒ කමිටුවේදීත් මට තිබුණා ඕවා ගැන කරුණු කියන්නේ නැතුව මගේ විරෝධතාවය ලියාගන්න ගරු සභාපතිතුමනි කියලා කියන්න. එතෙකොට මම බේරිලා. ඒ හින්දා මේකේ ප්‍රශ්න තියෙනවා නීතියේ ගැටළු තියෙනවා. ප්‍රදේශිය සභා පනත මොන විදියකට අර්ථකථනය කළත් යම් යම් තැන්වල අපි ගැටෙන තැන් තියෙනවා, ඒක අවබෝධ කරගන්න. ගරු සභාපතිතුමනි, ඔබතුමා ගෙනාපු යෝජනාව හොඳයි. යෝජනාව ක්‍රියාත්මක කරන්න අපි විරුද්ධ නැහැ. නමුත් ඕක ක්‍රියාත්මක කරනවා කියලා අවුරුදු 23 ක් විතර අවංකව සමාජයේ වැඩ කරලා ඉතිරි කාලේ මාංචු කුට්ටමක් දාන් යන්න බැහැ. ඒ බේස්ලට් එක දාගන්න උවමනාවක් නැහැ. මේ ක්‍රමවේදය ඇතුළේ තවත් ප්‍රශ්න තියෙනවා අවශ්‍ය නම්, ග්‍රාම නිලධාරිගේ නිර්දේශයක් අරගෙන මෙතුමා කියනවා වගේ මරණාධාර සමිතියේ මහ සභාවේ සම්මත කරගන්න, එතකොට මරණාධාර සමිතියේ නිළධාරීන් වගකීම ගන්නේ.

ඒකේ නිලධාරීන්ගේ හා සාමාජිකයන්ගේ අත්සන් ලේඛනයක් ඇතුළත් කළාම ඒ මත පදනම් වෙලා තින්දු ගන්න පුළුවන්. අපි හිරේ යන්නේ නැතුව බේරෙන්න ඕනි ඒකයි මේ කියන්නේ. ක්‍රමානුකූලව ග්‍රාම නිලධාරි නිර්දේශය සහ කොමසරිස්තුමා හරහා යවලා කරගමු. එහෙම නැතුව දේශපාලනික වශයෙන් අරන් යනකොට විරුද්ධයි. අපි යමක් පෙන්නලා දුන්නහම ගරු සභාපතිතුමා ඒක පාවිච්චි කිරීම සුදුසු නැහැ. මුලින්ම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දාලා ඒ හරහා දිස්ත්‍රික් සම්බන්ධීකරණයට යොමු කරලා අවශ්‍ය නම් කැබිනට් අනුමැතියටත් යවන ක්‍රමවේදයක් තියනවනේ. අපි දේශපාලනික න්‍යාය පත්‍රය අනුව වැඩ කරනවා නම්, ඒවා ඇතුළේ යන්න පුළුවන් ක්‍රම අපිත් දන්නවා. එහෙම කරන එක නෙමේ නිවැරදි වැඩේ. ඔබතුමාලට යමක් පෙන්වලා දුන්නාම, ඔබතුමා ඒක අවබෝධ කරගෙන අපිත් එක්ක සහයෝගයෙන් කතා කරලා කටයුතු කරමු. මම ඊළඟ මරණධාර සමිතියට යනවා. මම ගිහින් අහනවා මේකට විරුද්ධ උනේ මම. හැංගිලා කතා කරන්න උවමනා නැහැ. ගරු සභාපතිතුමනි, මේ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවේ මේ අනිත් කරුණු ගරු ආණ්ඩුකාරතුමාට යවන්න අවශ්‍ය නැහැ. ඩෝසර් කිරීම විතරයි යන්න ඕනි. වැට ගහන සහ ප්‍රවේශ මාර්ග හදන ඒවා ඔබතුමාගේ අනුමැතියට යටත්ව කරන්න තියෙන්නේ. ඒ නිසා මේක හොඳ යෝජනාවක් මම කියන එක ඔබතුමා දැනුත් වැරදියට තේරුම් ගන්නවා නම් ඒකත් ඔබතුමාගේ තත්වයක්. මම මොකක්ද කීවේ කියලා අබෝධයෙන් තේරුම අරගෙන ඔබතුමා කටයුතු කරන එක ඔබතුමාගේ වැඩක්. මට කිසි ප්‍රශ්නයක් නැහැ ඔබතුමා ගෙනාපු යෝජනාවට අපිත් සහයෝගය දෙන බව ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා ස්තූතියි.

ඒ අනුව, ඉහත සඳහන් කුරුණු හේතුවෙන් අලව්ව ප්‍රාදේශීය බල ප්‍රදේශයට අයත් ග්‍රාමීය ජනතාවට සුසාන භූමි සම්බන්ධයෙන් මුහුණ දීමට සිදුව ඇති ගැටලුවලින් මුදා ගැනීම සඳහා සුසාන භූමි ආඥා පනතේ 5 වන වගන්තියේ 1 හා 3 යන උප වගන්ති ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සුසාන භූමි යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් සංවර්ධනය කර භාවිතයට සුදුසු ලෙස සකස් කර දීමට අවශ්‍ය විශේෂ අනුමැතියන් පළාත් පාලන කොමසාරිස්ගෙන් හෝ අමාත්‍යවරයාගේ බලතල පැවරී ඇති ආණ්ඩුකාරවරයාගෙන් ලබා ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05.6)<u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/05/06/06 දරණ යෝජනාව</u>**

2025 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ මිලදී ගැනීමට නියමිතව ඇති ස්කිට් ස්ටියර් ලෝඩරය සඳහා ලංසු ඇගයීම් කමිටු සාමාජිකයන් ලෙස යාන්ත්‍රික ඉංජිනේරු ආර්.එම්.සී.ප්‍රියනන්ද මහතා (යන්ත්‍රෝපකරණ අධිකාරිය), යාන්ත්‍රික ඉංජිනේරු ඩබ්.ඊ.නිරෝෂන් මහතා (පළාත් පාලන දෙපාර්තමේන්තුව), වැඩ අධිකාරී වයි.එම්.එම්.ටී.බී. උඩවෙල මහතා (අලව්ව ප්‍රාදේශීය සභාව) යන නිලධාරීන් 2025.07.11 දිනැති මහසභා තීරණ අංක 5.12 ට අනුව පත් කර ඇති අතර, ඊට අමතරව කමිටු සාමාජික ලෙස ගණකාධිකාරී ජී.බී.එල්.රංජනී මිය ( ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) පත් කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>06.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම</u>**

**(6.1)<u>2025.09.19 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.09.19 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.09.19 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.09.19 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(6.2) <u>2025.09.23 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව</u>**
**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.09.23 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.09.23 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.09.23 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(6.3) <u>2025.09.23 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව</u>**
**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.09.23 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.09.23 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.09.23 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(6.4) <u>2025.09.24 සහ 2025.10.08 දිනයන්හි පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා</u>**
**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.09.24 සහ 2025.10.08 දිනයන්හි පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.09.19 සහ 2025.10.08 දිනයන්හි පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.09.19 සහ 2025.10.08 දිනයන්හි පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(6.5) <u>2025.09.24 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව</u>**
**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.09.24 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.09.24 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.09.24 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(6.6) 2025.09.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.09.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.09.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.09.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

## 07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම

**(07.1) 2025 සැප්තැම්බර් මාසය - ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 සැප්තැම්බර් මාසය ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 සැප්තැම්බර් මාසය ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 සැප්තැම්බර් මාසය ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(07.2) 2025 සැප්තැම්බර් මාසය -ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශ සහ ආදායම් පුරෝකථන වාර්තාව**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 සැප්තැම්බර් මාසය ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 සැප්තැම්බර් මාසය ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 සැප්තැම්බර් මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**08.** **වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, වෙනත් කරුණු යටතේ කියන්න කැමතියි සභාට එන්නත් කලින් ලේකම්තුමියට කරදර කරපු ප්‍රශ්නයක් තමා මේ බුංවලේ ප්‍රශ්නය. අපි ඒක පටන් අරන් ප්‍රජාවත් ගෙන්නලා ඒක අමතක කරා. ඒත් ඒක ප්‍රජාව මට අමතක කරන්න දෙන් නැහැ. මම පහුගිය දවස්වල මෙතෙන්ට එනකොට තාක්ෂණික නිලධාරීතුමයි, කුරුණෑගලින් ආපු ඉංජිනේරු තුමයි ලෙවල් අරන් දෙන්න කියලා ගියා. එවෙලේ මම වෙල්වල ඉන්න ගොවි ජනතාවත් එකතු කරා. මොකද බෝක්කු කැට තිබ්බහම අපේ වෙලේ වතුර බහින් නැහැ කියලා කියයි, එක්කෝ අපේ වෙලේ වතුර රැදෙන් නැහැ කියයි ඒ නිසා ඒ ප්‍රජාවත් මම ඒකට සම්බන්ධ කරා. කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීතුමියටත් කතා කරා. ඊයේ පෙරේදාත් මම එතනින් යනකොට නූලක් ගහලා තියන නිසා ලෙවල් දීලා කියලා හිතුවා. කොන්ත්‍රාත් සමාගමේ අයිතිකරුගෙන් විමසුවාම ඩම්පි ලෙවල් එකක් හොයාගන්න නැහැ කියලා කීවා. මේ සභාවේ නැත්නම් ඔබතුමාගේ කොන්ත්‍රාත් පදනම මත ඒක නැද්ද කියලා ඇහුවා. ඒක සභාවෙන් අරන් දෙන්න ඕනි කියලා එයා කීවා. ඒකේ බයිරෝඩ් එක හදන එකත් සභාවට තමා කරලා දෙන්න වෙලා තිබුණේ . සාමාන්‍ය මිනිස්සු මේකට ඇහුම්කම් දුන්නත්, පසුගිය දවස්වල අපි කොච්චර කීවත් ලොකු ටිපර් තියෙන මිනිස්සු මේකට ඇහුම්කම් දෙන් නැහැ. ආයේත් ටිපර් ගිහින් මඩවෙලා තියෙන්නේ, ඊයේ මම යනකොට මගේ බයිසිකලෙත් පෙරලෙන්න ගියා. ඒක නැවත අපි පොඩ්ඩක් සකස් කරන්න වෙයි හැබැයි කොන්ත්‍රාත් සමාගම ඇවිල්ලා එතන හිටියා නම් එයාට කියලා කොහෙන් හරි පස් ටිකක් ගෙනල්ලා දාගන්න පුළුවන්කමක් තිබුණා ඒ නිසා ලබන අවුරුද්දේ අපිට ගෙවන මාසික වැටුපක් හරි නවත්තලා අපිට අත්‍යාවශ්‍ය උපකරණ ගමු කියලා මම මේ ගරු සභාවට යෝජනාවක් කරනවා. ඔබතුමා මැදිහත් වෙලා ඉක්මනින් ඒ ඩම්පි ලෙවල් එක ගමු ඉදිරියටත් ඒක අවශ්‍ය වෙයි. මමත් පෞද්ගලිකව හඳුනන කොන්ත්‍රාත් සමාගම් දෙකකට කතා කළා ගලිගමුව අඹේපුස්ස මාර්ග හදන කන්ලස්ටන් ඇන්ඩ් ඉංජිනියර්ස් කන්ස්ට්‍රක්ෂන් එකට ඒගොල්ලෝ වැඩ ඉවර වෙලා ඒක අරන් ගිහිල්ලා කීවා. මම දන්න මැටීරියල් ඉංජිනියර් කෙනෙක් ඉන්නවා එයාටත් කතා කළා එයාලගේත් මේ ළඟපාත ඩම්පි ලෙවල් එකක් නැහැ කීවා. නැවත අද උදේ කුරුණෑගල මාර්ග සංවර්ධන අධිකාරියේ රඹුක්කන - පොතුහැර හයිවේ එක කොටසේ වැඩ කරන ඉංජිනේරු මහත්මියක් සම්බන්ධ කරගන්න මම උත්සාහ කරා. ඒත් එතුමිය දුරකථනයෙන් සම්බන්ධ කරගන්න බැරි වුණා. මේකට මැදිහත් වෙලා ලෙවල් කිරීම සඳහා ඩම්පි ලෙවල් එක්ක ඉල්ලලා දෙන්න හේතුව තමා, ඊළඟ මහා වැස්සක් එනවා ඊට කලින් මේක පටන් ගන්න වෙනවා. අරුණ මන්ත්‍රීතුමා උදේම ඇවිත් අද මගෙන් ඇහුවේ බුංවලේ වැඩේ පටන් අරන් කරගෙන යනවද කියලා. එයාලටත් ප්‍රජාවගෙන් මැසිවිලි එනවා. ඒ නිසා ඒකට ඔබතුමා මැදිහත් වෙලා ඉක්මනින් ඒ මිණුම් කටයුත්ත කරන්න උදව් කරන්න. අනිත් කාරණය තමා ගරු සභාපතිතුමනි, මම දකින දෙයක් තියනවා. අපි යන්ත්‍රෝපකරණයක් ප්‍රාදේශීය සභාවෙන් මොකක් හරි වැඩකට එළියට නිකුත් කරනවා නම්, ඒකට නිලධාරී මහතෙක් යොමු කරලා මොකක්ද කරන වැඩේ, ඒ වැඩේ කරන්නේ කොතනද එතන වෙන මොනවා හරි කොන්ත්‍රාත් පදනම යටතේ ක්‍රියාත්මක වෙන ව්‍යාපෘතියක් යනවද කියලා අධීක්ෂණය කරන්න පුළුවන් නම් හොඳයි. පෙර යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් භාරව හිටියේ නිලධාරී මහතෙක් දැන් ඉන්නේ නිලධාරි මහත්මියක්, එතුමියට ඒ සඳහා යන පහසුකම් ටික තියනවාද කියලා අපි දන් නැහැ. ඒ නිසා මින් ඉදිරියට ඒ සඳහා කටයතු කරමුයි කියලා ඉල්ලා සිටිනවා. පොහොසක් රටක් හදාගෙන ලස්සන ජීවිතයක් මිනිස්සුන්ට උරුම කරලා දෙන්න තමා අපේ සහ අතිගරු ජනාධිපතිතුමාගේත් තේමාව, ඒ නිසා ඔබතුමත් ඒ මතයේ ඉඳගෙන සභික අපි 26 දෙනාමත් ඒ මතයේ ඉදලා වැඩ කරමු. අපි සද්භාවයෙන් වැඩ කරන්නේ. මම මාසයකට බයිසිකලේට රු.18000.00 ක තෙල් ගහනවා. පහුගිය දවස්වල අග්බෝවේ අපේ සහෝදර මන්ත්‍රීතුමා අසනීපවෙලා හිටියා එතකොට ඒ ප්‍රදේශයේ ප්‍රජාවත් අපිට කතා කරනවා. බෝයවලාන දිහාත් ප්‍රශ්න තිබ්බොත් අපිට කතා කරනවා. එම ප්‍රදේශයේ ගරු මන්ත්‍රීතුමා ජනතාවට කියලා තියනවා ඕකට උද්ධාල මන්ත්‍රීතුමා කතා කළොත් මැදිහත් වෙයි කියලා. ඒවගේ අපි ඉදිරියට යනකොට මෝඩර් ග්‍රේඩරය හෝ කුමන හෝ උකරණයක් එළියට යවනවා නම් නිලධාරී මහත්මියක් හෝ නිලධාරී මහතෙක් ඒ සඳහා යොමු කරලා ඒ වැඩේ කොහොමද සිදු වෙන්නේ කියලා සොයා බලමු. ගරු සභාපතිතුමනි, අනිත් එක තමා අපි පාරවල්වල ඉදි කිරීම් කටයුතු කරද්දී මමත් ආසියානු සංවර්ධන බැංකුවෙන් ආධාර දෙන කොන්ත්‍රාත් සමාගමක ව්‍යාපෘති කාර්යාලයක ලැබ් අංශයේ වැඩ කරපු නිසා දන්නවා පාරක් ඉදි කරනකොට පාරක නිකම්ම මෝටර් ග්‍රේඩර් එක හෝ JCB එක අල්ලන් ගිහිල්ලා පාර සමතලා කරලා කොන්ක්‍රීට් එක දැම්මොත් එතන ලූස් පොයින්ට්

එකක්, තෙත තැනක් තිබ්බොත් කාලයක් ගිහින් එතන ගිලා බහිනවා. ඒ නිසා අපි දන්නවා ප්‍රාදේශීය සභා පාරවල් සංවර්ධනය කරද්දී, තාක්ෂණික නිලධාරීන් කොන්ත්‍රාත් සමාගම්වලට රෝල දාන්න කියලා තියනවා ඒක ඒ පාරේ හැටියට තමා රෝල ටොන් 02ද, 05ද, 10 ද කියන්නේ. ඒ නිසා පහුගිය දවස්වල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ TO මහත්වරු හෙණ්ඩුවාවේ මෝටර්වත්තට යන මාර්ගයේ පාරක් කොන්ක්‍රීට් කරන්න පටන් ගත්තා. කොන්ත්‍රාත් සමාගමේ පුද්ගලයා ඇවිත් පාර නිකම්ම අල්ලලා කොන්ක්‍රීට් එක දාන්න හදනකොටම ලූස් පොයින්ට් එකක් දැකලා අපි කතා කරා. ඒ නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්ද , විමධ්‍යගත අයවැයෙන්ද, රේඛීය අමාත්‍යාංශයෙන්ද කොහෙන්ද කියන එක නෙවේ අපි සභාවේ සභිකයෝ ලෙස කොහේ හරි කොට්ඨාසයක මන්ත්‍රීවරයෙක් ඉන්නවානේ, ඒ නිසා මෙන්න මේ වැඩේ යනවා මැදිහත් වෙලා කටයුතු කරන්න කියලා ඔබතුමා එතුමාව දැනුවත් කරන්න. අපි නොදන්න දේවල් ඉගෙන ගන්න කට්ටිය ගොඩාක් ඉන්නවා. හිතවත් කොන්ත්‍රාත් සමාගම්වල කට්ටිය ඉන්නවා ඒවාගේ ඉංජිනේරු මහත්තයෙක් ගෙන්නලා හරි මේක අපේ විදිහට වෙනවාද කියලා බලන්න පුළුවන්. අතිගරු ජනාධිපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සහ ආයතනවල ඉන්න නිලධාරීන් අමාරුවෙන් ඉතිරි කරලා එවන මුදල් ටික, ඒවගේම සභාවෙන් අපි ලොකු කැපකිරීමක් කරලා ඉතිරි කරන මුදල් ටික ප්‍රජාවගේ සංවර්ධනය වෙනුවෙන් වෙන් කරනකොට ඒක ගුණාත්මකව හොඳ ප්‍රමිතියකින් යුතුව කරන්න අපි කටයුතු කරමු ඒ සඳහා ඔබතුමා අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ප්‍රජාවගේ දැඩි ඉල්ලීම අනුව මම මේ ඉල්ලීම ඉදිරිපක් කරන්නේ. වැලිකරේ මධ්‍යම බෙහෙත් ශාලාවේ මීට අවුරුදු 30 ක පමණ කාලයක සිට වෛද්‍යවරයෙක් ආවා ගියා. ඒකෙන් විශාල සේවාවක් සිදු වුණා. ඒ වගේම දැනට මාස 03 ක විතර පෙර, දවසකට රෝගීන් 150 ක් 200ක් ප්‍රතිකාර ලබා ගත්ත ආයතනයක්. හිටපු වෛද්‍යතුමිය විශ්‍රාම ලැබුවා. එතුමිය නිවාඩු නොගෙන ලෙන්ගතුකමකින් කැපවීමෙන් රෝගීන්ගේ ප්‍රතිකාර කටයුතු සිදු කරගෙන ගියා. එතුමියගෙන් පසුව පැමිණි වෛද්‍යතුමිය සතියකට දින දෙකක්වත් රෝගීන්ට ප්‍රතිකාර ලබා දීම සඳහා වෛද්‍ය මධ්‍යස්ථානයට පැමිණෙන් නැහැ. ඔබතුමාට හැකි නම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය දැනුවත් කරලා මේ සම්බන්ධයෙන් සොයා බලන්න. මම පුතාට අසනීප වෙලා සෙනසුරාදාත්, අඟහරුවාදත්, ගිය බදාදත් ගියා ඒ දවස් ටිකේම නැහැ. එතන විශාල සායන ප්‍රමාණයක් තියනවා. මිනිස්සු වෙනුවෙන් තමා සායන තිබ්බේ. දෛනිකව ප්‍රතිකාර ලබන රෝගීන් සායනවල ඉන්නවා. හැමදාම ඒ රෝගීන්ගේ ප්‍රශ්න ඉදිරියට යනවා. එමනිසා වෛද්‍යාචාරතුමිය වෛද්‍ය මධ්‍යස්ථානයට නොපැමිණීම සම්බන්ධව සොයා බලා කටයුතු කරනවා නම් මැනවි කියලා මා ප්‍රකාශ කරනවා. ඒ වගේම මගේ කොට්ඨාසයේ මාත් එක්ක සුහදශීලීව කටයුතු කරන උද්ධාල මන්ත්‍රීතුමාටත් මේ ගරු සභාව හමුවේ ස්තූතිය ප්‍රණාමය පුද කරනවා. අපි කුහක විය යුතු නැහැ අපි කරන හොඳ කටයුතුවලදී ඔබත් සමඟ හැමවෙලේම අත්වැල් බැඳගෙන කටයුතු කරන්න තමා මහජන නියෝජිතයෝ ලෙස තේරීපත් වුණේ. ඒකේදී උද්ධාල මන්ත්‍රීතුමත් විශාල කැපකිරීමක් කරනවා. අපි පක්ෂ දෙකක් නියෝජනය කළත් සහයෝගයෙන් කතාබහ කරලා කටයුතු කරගෙන යනවා. දේශපාලනික වශයෙන් අපි සුහදශීලිව කටයුතු කළ යුතු වෙනවා මහජන නියෝජිතයෝ හැටියට මහජනතාවට සේවය කළ යුතුයි. පැහැර හැරුණු දේවල් සිදු කරන්න ඕනි. ඔබ සිදු කරන සාධාරණ කටයුතුවලදී ඔබට මම සහයෝගය දුන් නැත්නම්, මහජනතාවට කරන අසාධාරණයක් කියලා හිතනවා. මගේ කොට්ඨාසයට පමණක් නොව අනිත් කොට්ඨාසවලටත් එවන් දෙවල් සිදු කරන්න ඔබතුමාට ශක්තිය ධෛර්යය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේක අවස්ථාවක් කර ගන්නවා මගේ මාමණ්ඩිගේ අවමංගලයට සහභාගී වී අවසන් කටයුතු දක්වාම ඔබට හැකි ආකාරයෙන් මන්ත්‍රී මණ්ඩලයක් ලෙස, ඔබ සියලු දෙනා මා සමඟ දුකසැප බෙදා ගැනීම සම්බන්ධව ගරු සභාපතිතුමාටත්, ගරු මන්ත්‍රී මණ්ඩලයට සහ ලේකම්තුමිය ප්‍රමුඛ නිලධාරී මණ්ඩලයටත් මගේ අවංක ආදර ස්තූතිය පුදකරනවා. මේ සභාවට මහජන නියෝජිතයෝ හැටියට ආවහම සංයමයක් ඉවසීමක් සහ ගෞරවාන්විතව කටයුතු කිරීමක් තියෙන්න ඕනි. ඕනිම කෙනෙක් ඕනිම දෙයක් කරාම ඒ සම්බන්ධයෙන් අගය කිරීමක් තියනවා.

මට මතක් වෙනවා දයාසිරි ජයසේකර මගේ කල්‍යාණ මිත්‍රයා මහඇමති වෙලා ඉන්න කාලයේ. සමන්ත යත්තල්ගොඩ මන්ත්‍රීතුමා එතුමාගෙන් ඉල්ලීමක් කරාම මමත් එතුමාට කතා කරා. ලොකු උදව්වක් පාරවල් ගණනාවක් දකුණු කොරලයේ තියනවා. මෙම පාරවල් කඩා වැටිලා තියෙන්නේ. ඒක දකුණු කෝරලයේට පාඩුවක්. ආසියානු සංවර්ධන අරමුදලෙන් ප්‍රතිපාදන ආවොත් මේ ගැනත් පොඩ්ඩක් හිතන්න කියලා. ඔබේ ගම පඩුවස්නුවර උනාට අලව්වත් ඔබේ ගම කියලා හිතන්න කීවා. එවකට හිටපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරා වගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරායා හැටියට ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාට කතා කරාම හොඳ යෝජනාවක් කළේ. මාත් දයාසිරි මන්ත්‍රීතුමාගෙන් ඉල්ලන් නම් කීවා. මේ සියලු දෙනා කරපු ඉල්ලීම අවසන් උනේ ගොරොක්ගස්දෙණිය පාර, ගල්වාරම පාර, මාපිටිය කන්ද මුදුනෙන් යන හයිරෝඩ් පාර , හයේ කණුවේ ඇපරල් එක ඉදිරිපසින් යන පාර සහ ගල්දෙණිය පාර මීරිගම තැන්පිටිය හයිරෝඩ් දක්වා මේ පාරවල් පහටම යෝජනාව දාලා සම්මත කරලා මුදල් දුන්නා. ඉදි කිරීම් සමාගම් සමඟ ඇති කරපු ගැටුමක් සමඟ මේ ව්‍යාපෘතීන් නතර වෙලා ආපහු මුදලුත් ගිහින් තියෙද්දී , නැවත වතාවක් යහපාලන රජය ඇවිල්ලා එවකට ආසනයේ ආණ්ඩු පක්ෂ සංවිධායක වශයෙන් මට තිබුණු බලතල භාවිතා කරලා හිටපු ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා හමු වෙලා ජනාධිපතිතුමාටත් කතා කරන්න කීවා. ඊට පස්සේ මම හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සමඟ කතා කරාම එතුමා කීවා කිසිම ප්‍රශ්නයක් නැහැ මේකේ එක පාරක් හරි සංශෝධනය කරන්න තියේ නම් ඒකත් කරන්න කියලා එතුමා කීවා. මම කීවා කිසිම සංශෝධනයක් නැහැ කියලා. මහජන ඉල්ලීම් සභාවක පෙළ ගැසුණු ඒවා තමා මේ ඇවිත් තියෙන්නේ කියලා කීවා. මේක ලොකු දෙයක්. අවසානයේ ඒකට අපිට මුදල් ලැබුණා. ඒවගේම අපි ඒ පවරපු පාරවල් පහේම වැඩ කටයුත්ත නිවැරදිව හා නිසිආකාරයෙන්ම ආසියානු සංවර්ධන අරමුදල ටෙන්ඩර් කරන්න කියලා ඒ දේ විවෘත ටෙන්ඩර් ක්‍රමය හරහා නිවැරදිව සිදු කළා. ඒවෙලාවේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා අරලියගහ මන්දිරේදී මුණ ගැසිලා කීවා මේ පාරක් අවුරුදු 20 ක් කල් පවතින්න කරගන්න , රෑ 12ටත් තනියම පාරක යන්න ඉඩ තියාගන්න කියලා කීවා. ඒකේ අර්ථ කථනය වුණේ ඔබ මේක නිවැරදිව සිදු නොකර කුණු ගා ගත්තොත් රෑට මිනිස්සුන්ගෙන් පාරේ යන්න වෙන් නැහැ කියලා. අපි ඒක හරියට කරා. ඒවගේම අලව්ව මහජන ක්‍රීඩාංගනයට මම ගිහින් එවකට හිටපු ආණ්ඩු පක්ෂ සංවිධායක හැටියට ක්‍රීඩා ඇමති නලීන් දිසානායක මැතිතුමා මුණ ගැහිලා එතුමාගෙන් අලව්ව ක්‍රීඩාංගනය නවීකරණය කරන්න මුදල් ඉල්ලුවා. එතුමා මුදල් දීමේ ගැටලුවක් තියනවා කීවා ඒත් එතුමා ලක්ෂ සියයක් දෙන්න පොරොන්දු වුණා. එවකට ප්‍රාදේශිය ලේකම් හිටියේ කිරිගොල්ල මැතිතුමා ආණ්ඩුව යනකල් එතුමා ඇස්තමේන්තුව හැදුවා. 2015 මහමැතිවරණය එනකල් ඇස්තමේන්තුව හැදුවා. ඊළඟට දායාසිරි ජයසේකර මැතිතුමා ක්‍රීඩා ඇමති වුණාම අරුණ ජයලත් මන්ත්‍රීතුමාට කතාකරලා මේකට දයාසිරි ජයසේකර මැතිතුමාගෙන් උදව්වක් ගන්න බැරිද කියලා ඇහුවා. අලව්ව මහජන ක්‍රීඩාංගනයට අවශ්‍ය කරන ක්‍රීඩාගාරය ලබා දුන්නා. නමුත් එතුමා අරුණ ජයලත් මන්ත්‍රීතුමාට කියලා තිබුණා සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයේ ප්‍රමුඛත්වය මත මේක ඉදි කරන්න ඕනි මේක සභාවට දීපු දෙයක් මෙතන ඉදලා මහජන මන්ත්‍රී මණ්ඩලය සහ නිලධාරීන් පාවිච්චි කරන්නේ මුල්ගල තියන වෙලාවේ අනිවාර්යෙන්ම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු ඉන්න ඕනි නැත්නම් මම සහභාගී වෙන් නැහැ කීවා. මහජන නියෝජිතයෙක් හැටියට දේශපාලනයේ පෞරෂත්වයක් තියෙන්න ඕනි. දේශපාලනයේ ප්‍රතිවාදියා ගරු සභාපතිතුමා නම්, මේ සභාව තුළ මම ප්‍රතිවිරුද්ධව කටයුතු කරද්දි ඒකට ප්‍රති උත්තර දෙන එක ඔබතුමාගේ දෙයක්. මේ මිත්‍රශීලි දේශපාලනය ඇති වීමට හේතුව මම සහ ඔබතුමා තමන්ගේ අනන්‍යතාවය තුළ රැඳුණු දෙන්නෙක් නිසයි. ගරු සභාපතිතුමා මේවා සිහි කරනවා නම් ගොඩාක් නොදන්න දේවල් තියනවා. මම හැමදාම අම්මා තාත්තා අමතක නොකරපු මිනිහෙක් හැටියට, පී.බී. වැත්තෑව මැතිතුමා දඹදෙණිය ආසනයේදී කරපු සංවර්ධන කටයුත්ත, ඊට කලින් ආර්.ඩී. සේනානායක මැතිතුමා කරපු සංවර්ධන කටයුත්ත තල්වත්ත නවතල්වත්ත කරේ එතුමා. අලව්වට ඩිපෝ එක ගෙනත් දුන්නේ පුංචි බණ්ඩා වැත්තෑව මැතිතුමා. මෙහෙම අඩු වැඩි වශයෙන් ආපු ගමනේ සෙනරත් සුගතදාස මැතිතුමා , යූ.බී. විජේකෝන මැතිතුමා , ඊළඟට ශාන්ත බණ්ඩාර මැතිතුමා මේ සියලු දෙනාගේම මැදිහත් වීම මත 2015 දී මම ලක්ෂ 1200ක් දඹදෙණි ආසනයේ ග්‍රාම නිලධාරි වසම් 120 ට ගෙනාවා. මම එදා යනකොට පොඩි එකෙක් ඉදලා වෙන්නොරුවේ ක්‍රීඩාපිටියේ හදපු ගොඩනැගිල්ල පෙන්නලා පොඩි මහත්තයයි ඔයයි තමා මේක දුන්නේ කියලා කීවා. ඒ සතුට අපිට තියනවා. අනුර කුමාර ජනාධිපතිතුමා ආසනයේ පාර්ලිමේන්තු කෘෂිකර්ම ඇමතිවරයා හැටියට නුංගමුව අමුණ කරාම අදටත් අපිට ඒකනිසා ගරු කරනවා. ඒකෙන් තමා පහළ කෙත පෝෂණය වෙන්නේ. ඒ නිසා සෑම කෙනෙකුටම අඩු වැඩි වශයෙන් ගෞරවයක් සහ අභිමානයක් තියනවා.

ඒ අභිමානය රකින එක අපේ වගකීම වගේම ඒක කෙලෙසුණාම අපේ කෙලෙසෙන්නේ අපේ පෞර්ෂත්වය කියන එක මතක් කරමින් විශේෂයෙන්ම සභාවක් හැටියට ඔබ සියලු දෙනාම කරදරයකදී විපතකදී එකට එකතු වෙමින් මේ ගමන යමු කියලා මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වු ගරු උප සභාපතිතුමිය ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියළු නිලධාරීන්ටත් ස්තූතිය පල කරන අතර අද දිනට නියමිත මහා සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 11.45 ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2025.10.09
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.